# 2017

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT



පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - කෘෂිකර්ම අමාත්‍යංශය

அறுவடைக்கு பிந்திய தொழிநுட்ப நிறுவனம் - கமத்தொழில் அமைச்சு

Institute of Post Harvest Technology - **Ministry of Agriculture,**

# වාර්ෂික වාර්තාව
# 2017

**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය**

**ප්‍රධාන කාර්යාලය**
අංක 28, බත්තරමුල්ල පාර, ඇතුල්කෝට්ටේ,
ශ්‍රී ලංකාව.
දුරකථන: +94-11-2887889
ෆැක්ස්: +94-11-2866846

**පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**
ජයන්ති මාවත, අනුරාධපුරය,
ශ්‍රී ලංකාව.
Tel: +94-25-3230004
Fax: +94-25-2223983

වෙබ් අඩවිය: www.ipht.lk

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය,
අංක 28 ,
බත්තරමුල්ල පාර,
ඇතුල්කෝට්ටේ.

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
අංක 288,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රජගිරිය.

ගරු අමාත්‍යතුමනි,

<u>වාර්ෂික වාර්තාව - 2017</u>

1971 අංක 38 දරන මූලා පනතෙහි 14(2) ඡේදය ප්‍රකාරව,2017 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

කාවින්ද සී දිසානායක
සභාපති
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## පනත සහ නීතිමය පසුබිම

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය, සියලුම කෘෂිකාර්මික භෝග පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2000 වර්ෂයේ ජූනි මස 19 දින පිහිටුවන ලදී. 1976 වර්ෂයේදී FAO/UNDP සහාය ඇතිව පිහිටුවන ලද වී අළෙවි මණ්ඩලයේ අනුරාධපුර පිහිටි සහල් සැකසීමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි (RPRDC) කාර්යයන් අලුතින් ස්ථාපනය කරන ලද ආයතනය විසින් පවරාගනු ලැබිණි. සහල් සහ ධාන්‍ය පිළිබඳව පමණක් නොව එළවලු, පලතුරු, කුළුබඩු සහ කපන ලද මල් වැනි වෙනත් ක්ෂේත්‍ර භෝග පිළිබඳවද පසු අස්වනු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමේ කාර්යයන් සහ වගකීම් අලුතින් පිහිටුවන ලද ආයතනයට පවරා දෙන ලදී.

**අධිකාරි බලය**

ගැසට් නිවේදනයේ දැක්වෙන විධිවිධානයට අනුව, ශ්‍රී ලංකාවේ පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ අවශ්‍යතා හඳුනාගැනීම සහ ප්‍රමුඛකරණය කිරීම සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා අදාළ සියලු නියෝජිතායතන ඒකරාශී කිරීමේ සම්බන්ධීකරණ ආයතනය ලෙස පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය කටයුතු කළ යුතු වේ.

**දැක්ම**

ජාතික ආහාර සුරක්ෂිතතාවය සඳහා තිරසර පසු අස්වනු සංවර්ධනයේ විශිෂ්ටත්ව කේන්ද්‍රස්ථානය වීම.

**මෙහෙවර**

තරඟකාරී මිලකට දේශීය සහ අපනයන වෙළෙඳපොළ අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෘෂිකාර්මික අස්වැන්න සහ නිෂ්පාදනවල සැපයුම් සහ වටිනාකම් දාම ශක්තිමත් කිරීම සඳහා ඵලදායී සහ කාර්යක්ෂම පසු අස්වනු තාක්ෂණික මැදිහත්වීම් මඟින් ජාතික ආහාර සුරක්ෂිතතාවය තිරසර ලෙස සංවර්ධනය කිරීම.

## කළමනාකරණ මණ්ඩලය

2017 දෙසැම්බර් 31 වැනි දිනට

**සභාපති**

කාවින්ද සී දිසානායක

**උප සභාපති**

ආර්.පී.ඒ.රණවීර පතිරණ

**සාමාජිකයන්**

නන්දගෝපාලන් මහතා

එස්.පී.කුමාර ගුණරත්න මහතා

ඩී.බී.සරත් මහතා

එම්.එස්.කරුණාරත්න මහතා

ප්‍රියන්ත ජයතිස්ස මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

ඉංජි. මහේෂ් දිසානායක
*ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ*

## ආයතනික ව්‍යුහය

### අනුමත බඳවාගැනීමේ පටිපාටිය (SOR) අනුව ආයතනික ව්‍යුහය




ආයතනය 2016 වර්ෂයේදී මතු දක්වා ඇති පරිදි ප්‍රතිව්‍යුහගත කරන ලද අතර මුළු ආයතනික ව්‍යුහය සහ සේවක සංඛ්‍යාව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

1. පර්යේෂණ අංශය
2. ඉංජිනේරු සේවා අංශය
3. ව්‍යාප්ති අංශය
4. පරීක්ෂණාගාර සේවා අංශය
5. සැලසුම් සහ අධීක්ෂණ අංශය
6. සංවර්ධන ව්‍යාපෘති අංශය
7. පරිපාලන අංශය
8. මූල්‍ය අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

10. තොරතුරු තාක්ෂණ අංශය

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

2017 දෙසැම්බර් 31 වැනි දිනට

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි**
**ඉංජි. මහේෂ් දිසානායක**

**අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ තාක්ෂණ පැවරීම්)**
**ඉංජි. එච්.එම්.ජී.පී.රත්නායක**

**අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)**
**ආර්.ජී.කේ.පී.රාමනායක මහතා**

**පර්යේෂණ අංශය**
ආචාර්ය නිලන්ති විජේවර්ධන මහත්මිය
අප්‍ර | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි

**ඉංජිනේරු සේවා අංශය**
ඉංජි. බී.ඩී.එම්.පී.බණ්ඩාර
අප්‍ර | යාන්ත්‍රික ඉංජිනේරු

**ව්‍යාප්ති අංශය**
චමින්දි දිසානායක මහත්මිය
අප්‍ර | ජ්‍යෙෂ්ඨ ව්‍යාප්ති නිලධාරි

**පරීක්ෂණාගාර සේවා අංශය**
චමින්ද ගුණවර්ධන මහතා
අප්‍ර | පර්යේෂණ නිලධාරි

**සංවර්ධන ව්‍යාපෘති අංශය**
ඩබ්ලිව්.එම්.සී.බී.වාසල මහතා
අප්‍ර | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි

**සැලසුම් සහ අධීක්ෂණ අංශය**
රුවන්කා රත්නායක මහත්මිය
අප්‍ර | පර්යේෂණ නිලධාරි

**පරිපාලන අංශය**
ආර්.ජී.කේ.පී.රාමනායක මහතා
අප්‍ර | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය)

**මූල්‍ය අංශය**
නිලූක ඉලංගසිංහ මහතා
අප්‍ර | ගණකාධිකාරි

**තොරතුරු තාක්ෂණ අංශය**
ඉංජි. ඩී.එම්.එස්.පී.බණ්ඩාර මහත්මිය
අප්‍ර | යාන්ත්‍රික ඉංජිනේරු

**අභ්‍යන්තර විගණන අංශය**
ආර්.එම්.ඩී.රත්නායක මහතා
අප්‍ර | අභ්‍යන්තර විගණක

## කළමනාකරණ කමිටු

2017 දෙසැම්බර් 31 වැනි දිනට

### විගණන සහ කළමනාකරණ කමිටුව

| නම | තනතුර |
|---|---|
| ඉනෝකා ලංකාතිලක මහත්මිය | සභාපති |
| ආර්.පී.ඒ.රණවීර පතිරණ මහතා | සාමාජික |
| ඩී.බී.සරත් මහතා | සාමාජික |
| ඉංජි. මහේෂ් දිසානායක | ලේකම් |
| ආර්.එම්.ඩී.රත්නායක මහතා | කැඳවුම්කරු |
| ජේ.ඒ.එස්.ධම්මික පෙරේරා මහතා | නිරීක්ෂක |
| නාමරත්න මහතා | නිරීක්ෂක |

### පරිපාලන කමිටුව

| නම | තනතුර |
|---|---|
| කේ.ඩබ්ලිව්.ඊ.කරලියද්ද මහතා | සභාපති |
| අතිරේක අධ්‍යක්ෂ (A & F) | ලේකම් |
| අධ්‍යක්ෂ | සාමාජික |
| පරිපාලන නිලධාරි | සාමාජික |

### මූල්‍ය කමිටුව

| නම | තනතුර |
|---|---|
| එම්.එස්.කරුණාරත්න මහතා | සභාපති |
| අප්‍ර/මුදල් | ලේකම් |
| අතිරේක අධ්‍යක්ෂ (A & F) | ලේකම් |

### නීති කමිටුව

| නම | තනතුර |
|---|---|
| එස්.පී.කේ.ගුණරත්න මහතා | සභාපති |
| අතිරේක අධ්‍යක්ෂ (A & F) | ලේකම් |
| අධ්‍යක්ෂ | සාමාජික |

### ආදායම් සංවර්ධන කමිටුව

| නම | තනතුර |
|---|---|
| ප්‍රියන්ත ජයතිස්ස මහතා | සභාපති |
| අප්‍ර/සංවර්ධන ව්‍යාපෘති | ලේකම් |
| අතිරේක අධ්‍යක්ෂ (A & F) | සාමාජික |
| අතිරේක අධ්‍යක්ෂ (R & TT) | සාමාජික |
| අප්‍ර/ව්‍යාප්ති | සාමාජික |
| අප්‍ර/ඉංජිනේරු සේවා | සාමාජික |
| අප්‍ර/පරීක්ෂණාගාර සේවා | සාමාජික |
| අප්‍ර/සැලසුම් සහ අධීක්ෂණ | සාමාජික |

සංවර්ධන ව්‍යාපෘති කමිටුව

| නම | තනතුර |
|---|---|
| ඩී.බී.සරත් මහතා | සභාපති |
| අප්‍ර/සැලසුම් සහ අධීක්ෂණ | ලේකම් |
| අප්‍ර/ව්‍යාප්ති | සාමාජික |
| අප්‍ර/සංවර්ධන ව්‍යාපෘති | සාමාජික |

පර්යේෂණ නිකුත් කිරීමේ කමිටුව

| නම | තනතුර |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ (R & TT) | සභාපති |
| අප්‍ර/ව්‍යාප්ති | ලේකම් |
| අප්‍ර/පර්යේෂණ | සාමාජික |
| අප්‍ර/ඉංජිනේරු සේවා | සාමාජික |
| අප්‍ර/සැලසුම් සහ අධීක්ෂණ | සාමාජික |

## විධායක වාර්තාව | වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල සාරාංශය

2017 වර්ෂය ආයතනයට ඉතා සාර්ථක වසරක් විය. නව සභාපතිවරයා 2016 ජූලි මස පත් කරන ලදී. ඔහුගේ නව දැක්ම සමඟින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භෝගවල සැපයුම් සහ වටිනාකම් දාමය සංවර්ධනය කිරීම කෙරෙහි ආයතනය වැඩි අවධානය යොමු කර ඇත. සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සඳහා ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හතර එනම්, පර්යේෂණ හා සංවර්ධන, ව්‍යාප්තිය, පුහුණුව හා උපදේශන සහ වෙනත් සේවාවන් පෙළ ගස්වන ලදී.



දෙහි භෝගයේ රාක්ක ජීව කාලය ඉහළ නැංවීම සඳහා ඉටි ප්‍රතිකාරය

### පර්යේෂණ සහ සංවර්ධන

වර්ෂ 15කට පසු, ආයතනය විසින් පර්යේෂකයන් 10 දෙනෙකු බඳවා ගන්නා ලදී. 2017 වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති තිහක් (30) සිදු කර ඇති අතර එය, 2015 වර්ෂයේ සිට සිදු කරගෙන එනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති එකොළහකින් (11) සහ 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති දහ හතකින් (17) සමන්විත වේ. මීට අමතරව, පර්යේෂණ ව්‍යාපෘති හතරක් (04) රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස පවත්වන ලද අතර පෞද්ගලික අංශය විසින් අරමුදල් සපයන ලදී. NSF සහ NRC ප්‍රදානයන් යටතේ ව්‍යාපෘති දෙකක් (02) සහ ශිෂ්‍ය ව්‍යාපෘති වශයෙන් ව්‍යාපෘති දෙකක්ද (02) සිදු කරන ලදී.



තෙත වී සඳහා නව්‍ය වියළීමේ පද්ධතිය

### නව නිමැවුම්

- කෘෂි නිෂ්පාදනවල පසු අස්වනු ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා නිවැරදි සහ නවීන තාක්ෂණයන්
- වෙළෙඳපොළ තුළ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන ලද පලතුරු වැඩි කිරීම
- පාරිභෝගිකයන් සඳහා ගුණාත්මකභාවය වැඩිදියුණු කළ නිෂ්පාදන සහ නිෂ්පාදකයන්ගේ ආදායම වැඩි කිරීම



ශීතජනක විද්‍යාව භාවිතයෙන් මිරිස් කුඩුවල විශාලත්වය අඩු කිරීමෙන් තත්ත්වය වැඩිදියුණු කිරීම

### පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන සහ සම්මාන

- "නිර්මාංශ කේක් මිශ්‍රණය" සඳහා සහ 'කුළුබඩු ඇඹරීම සඳහා වාෂ්පීකරණ සිසිලන ක්‍රමය' සඳහා පේටන්ට් බලපත්‍ර දෙකක් ලැබිණි.
- අන්තර්ජාතික පර්යේෂණ ප්‍රකාශන සඳහා එක් ජනාධිපති සම්මානයක් ලැබිණි.
- පර්යේෂණ ප්‍රකාශන දෙකක් අන්තර්ජාතික සමාන ක්ෂේත්‍ර විද්‍යාඥයන් විසින් සමාලෝචනය කරනු ලබන ජර්නලවල පළ විය.

# සංවර්ධන ව්‍යාපෘති හරහා නව සහ සුදුසු තාක්ෂණයන් භාවිතයෙන් ජාතික ආහාර සුරක්ෂිතතාව කරා







සංවර්ධන ව්‍යාපෘති හරහා අඹ හැසිරවීම සහ සැකසුම් ඒකක ස්ථාපිත කිරීම: අඹවල සැපයුම සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම. "ඔමාරගොල්ල අඹ" සහ "පේරාදෙණිය අඹ" යන වෙළෙඳ නාම දෙක වෙළෙඳපොළට හඳුන්වා දී ඇත.





වර්තමාන සැපයුම් දාම කළමනාකරණ භාවිතයන් මඟින් සිදු වන එළවලු හානිය තක්සේරු කිරීම. සංවර්ධන ව්‍යාපෘතිය: ශ්‍රී ලංකාවේ කෘෂි අස්වැන්නෙහි සැපයුම් දාම කළමනාකරණය කිරීම

ආහාර සුරක්ෂිතතාව යනු සක්‍රිය සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සහ ආහාර අභිරුචිය සපුරාලන ප්‍රමාණවත්, ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීම සඳහා සියලුම පුද්ගලයින්ට සෑම විටම ශාරීරික, සමාජීය සහ ආර්ථික ප්‍රවේශයක් ඇති තත්ත්වයකි. දිවයිනෙහි ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා පඅතාආ විසින් සිය ව්‍යාපෘති ඉලක්ක ගත කර ඇත.

ඉහළ මිල, සුරක්ෂිත නිෂ්පාදන හා තරඟකාරී වෙළෙඳපොළ නිර්මාණය කරනු ලබන බැවින් නැවුම් නිෂ්පාදන අනාගතයේ මාවතයි

## පුහුණුව

ආයතනය විසින් ධාන්‍ය, අල සහ බල්බ, පලතුරු සහ එළවලු වර්ගයන්හි පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිෂ්පාදකයින්, සැකසුම්කරුවන්, වෙළෙඳ ව්‍යාපාරිකයන් සහ සේවකයින් සහ විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන් සඳහා නිෂ්පාදනය/ව්‍යාප්තිය ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් පවත්වයි. සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යයන චාරිකා ඇතුළුව නේවාසික පුහුණු පාඨමාලා හැට එකක් (61) පවත්වා පුද්ගලයන් 2036ක් පුහුණු කරන ලදී. ක්ෂේත්‍ර මධ්‍යස්ථාන තුළදී අනේවාසික පාඨමාලා එකසිය දහයක් (110) පවත්වා පුද්ගලයන් 2955ක් පුහුණු කරන ලදී.





## උපදේශන සහ වෙනත් සේවාවන්

පඅතාආ විසින් පසු අස්වනු කර්මාන්තයේ සෘජුව හෝ වක්‍රව නිරතව සිටින රාජ්‍ය, පෞද්ගලික සහ සමූපකාර අංශ සංවිධාන සඳහා උපදේශක හා උපදේශන සේවා සපයයි. 2016 වර්ෂයේදී අපතාආ මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ “ගබඩා ලදුපත් ව්‍යාපෘතියට” උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේදීද සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ඇඹිලිපිටිය, මැදිරිගිරිය සහ කිලිනොච්චියේ පෙර පිරිසිදු කිරීමේ හා වියළීමේ පහසුකම් සහිත ගබඩා ස්ථාපිත කෙරිණි.



තවද, ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් සිදු කරන ලද "ශීත ගබඩා ස්ථාපිත කිරීමේ" ව්‍යාපෘතියට පඅතාආ විසින් ඔවුන්ගේ තාක්ෂණික යෙදවුම් ලබාදී ඇත. වයඹ පළාතේ කාර්මික සේවා කාර්යාංශය සඳහා පඅතාආ විසින් තාක්ෂණික වාර්තා දෙකක් සකස් කර ඇත. ඔවුන්ගේ පහසුකම් වැඩිදියුණු කර ගැනීම සඳහා තවත් උපදේශන සහ තාක්ෂණික යෙදවුම් කිහිපයක් සමහර වී මෝල් කර්මාන්තවලට ලබා දී ඇත.



## වාණිජමය ආයතනයක් ලෙස වැඩිදියුණු කළ රසායනාගාර සේවා සැපයීම

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් 2017 වර්ෂය තුළ පාර්ශ්වකරුවන්ට රසායනාගාර සේවා සැපයීම සිදු කර ඇත. අපගේ පාර්ශ්වකරුවන් සඳහා රසායනාගාර පහසුකම් බැහැරට ලබා දීම ආයතනය විසින් ආරම්භ කර ඇත.



"ආර්ථික වශයෙන් වැදගත් කෘෂි භෝගවල බැර ලෝහ අපවිත්‍රනය නිශ්චය කිරීම" ප්‍රධාන ව්‍යාපෘතිය විය. මෙම ව්‍යාපෘතිය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශ අරමුදල් යටතේ දොඩම්, මිදි, අර්තාපල්, ලොකු ලූනු වැනි ආනයනික සහ දේශීය පලතුරු සහ එළවලු නියැදි පන්සියයක් (500) පරීක්ෂාවට ලක් කරන ලදී.



පසු අස්වනු ක්ෂේත්‍රය සඳහා පඅතාආ විසින් සංවර්ධනය කරන ලද යන්ත්‍ර සූත්‍ර

පසු අස්වනු ක්ෂේත්‍රයේ නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කළ යන්ත්‍රසූත්‍රවල යෝග්‍යතාව ඇගයීම පඅතාආ විසින් සිදු කරනු ලැබේ. මෙම ආයතනය, කර්මාන්තය සඳහා විකිණීමට ඇතැම් යන්ත්‍ර නිපදවනු ලබයි. වඩාත් හොඳින් අලෙවි වන යන්ත්‍රයක් වන්නේ ධාන්‍ය පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයයි. 2017 වර්ෂයේදී ක්ෂේත්‍රය සඳහා යන්ත්‍ර 06ක් ලබා දී ඇත.



## සාමාජීය, සුභසාධන සහ ආගමික ක්‍රියාකාරකම්

සේවක සම්බන්ධතා සහ සේවක සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල් අතර කීර්තිනාමය ගොඩනැංවීම සඳහා ආයතනය එහි සුභසාධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ජනාධිපති කාර්යාලයේ මඟපෙන්වීම අනුව, සේවකයින්ගේ දිනය 2017 අප්‍රේල් මස 08 වැනි දින පවත්වන ලදී. එදිනම සවස් කාලයේදී ආයතනයේ සුභසාධක සමිතිය විසින් කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුහද හමුවක්ද පැවත්විණි.





"සේවක දින" වැඩසටහනට සමගාමීව දිගු කාලීන සේවය ඇගයීම සිදු කරන ලදී. ආයතනය සඳහා වසර 25ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන්ට රුපියල් 50,000.00ක් වටිනා චෙක්පතක් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පිරිනමන ලදී.





වී අලෙවි මණ්ඩලයේ සහල් සැකසුම් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස 2000 වර්ෂයේ ජුනි 19 වන දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ලෙස ස්ථාපනය කර 17 වන සංවත්සරය සමරයි. මෙම තත්ත්වය සැමරීම සඳහා සහ කණ්ඩායම් හැඟීම වැඩිදියුණු කිරීම, ප්‍රදේශයේ ජනතාව ඒක රාශි කිරීම සඳහා 2017 ජුනි 19 වන දින "සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනයක්" පැවැත්විණි.





## මූල්‍ය කාර්ය සාධනය

2016 වසරට සාපේක්ෂව 2017 මූල්‍ය කාර්ය සාධනය සාධනීය වර්ධනයක් පෙන්වීය.

| විස්තරය | 2016 (රු.මි.) | 2017 (රු.මි.) | වර්ධනය (රු.මි.) |
|---|---|---|---|
| වර්ෂය සඳහා හිභය | (9.5) | (8.2) | 13.7 |
| මුදල් හා සමාන | 29.8 | 27.9 | -6.37 |
| මුළු ජංගම වත්කම් | 33.8 | 79.8 | 136.1 |
| මුළු ජංගම බැරකම් | 17.4 | 65.3 | 275.29 |
| ශුද්ධ වත්කම් (සමකොටස්) | 175.7 | 211.2 | 20.2 |

## මානව සම්පත්

වැඩබලන අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ පැවරීම්) ලෙස ඉංජිනේරු. එච්.එම්.ඒ.පී. රත්නායක මහතා පත් කරන ලදී. එක් පර්යේෂණ නිලධාරියෙකු සහ එක් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට සම්බන්ධ වීම සඳහා ආයතනයෙන් ඉල්ලා අස්විය. පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ පර්යේෂණ කණ්ඩායම ශක්තිමත් කිරීම සඳහා නව පර්යේෂණ නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගන්නා ලදී.

පඅතාආ එහි 18 වසරක ඉතිහාසයේ පළමු වරට එහි ප්‍රධාන කාර්යාලය අංක 28, ඇතුල්කෝට්ටෙ හන්දිය, බත්තරමුල්ල යන ස්ථානයේ වෙනම ගොඩනැගිල්ලක විවෘත කරන ලදී.

ඉංජි. මහේෂ් දිසානායක
අධ්‍යක්ෂ/ප්‍රවිනි

## කාර්ය සාධන විශේෂතා

### පර්යේෂණ සහ සංවර්ධන

පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූලික ක්‍රියාකාරකම වන පර්යේෂණ පැවැත්වීම පශ්වාත් අස්වනු කර්මාන්තයට මුහුණ දෙමින් සිටින තාක්ෂණික ගැටලු විසඳීම කරා ඉලක්කගත කර ඇත. 2017 වර්ෂයේ පර්යේෂණ වැඩසටහනට මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ යන දෙවර්ගයම ඇතුළු වුවද ප්‍රමුඛත්වය ව්‍යවහාරික පර්යේෂණවලට ලැබී තිබිණි.

2017 වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති දහ හතක් (17) සිදු කර ඇති අතර, 2016 වර්ෂයේ සිට සිදු කරගෙන එනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති දහයක් (10) එයට ඇතුළත් විය. 2017 වර්ෂයේදී නව පර්යේෂණ ව්‍යාපෘති හතක් (07) ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘති 7න් 3ක් සඳහා පෞද්ගලික අංශ අරමුදල් ලැබුණු අතර ව්‍යාපෘති දෙකක් (02) සඳහා ජාතික විද්‍යා පදනම සහ ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව අරමුදල් සැපයීය. තවත් ව්‍යාපෘති හතක් (07) ශිෂ්‍ය ව්‍යාපෘති වශයෙන් සිදු කරන ලදී.

පර්යේෂණ සොයාගැනීම්, පසු අස්වනු ක්ෂේත්‍රයේ වැඩිදියුණුව සඳහා නව තාක්ෂණ ලෙස එම ක්ෂේත්‍රය තුළ ව්‍යාප්ත කිරීමට අමතරව, අධ්‍යයනවල ප්‍රතිඵල ක්ෂේත්‍රයේ සමාන විද්‍යාඥයන් විසින් සමාලෝචනය කරනු ලබන ජාතික සහ අන්තර්ජාතික ජර්නලවල, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ, විවිධ විශ්වවිද්‍යාලවල පවත්වන සම්මන්ත්‍රණවලදී ප්‍රකාශයට පත් කරන ලදී.

## 2016 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති

1. ශීතජනක විද්‍යාව භාවිතයෙන් මිරිස් කුඩුවල විශාලත්වය අඩු කිරීම
2. සහල් සැකසීමේදී අධෝරක්ත (IR) කිරණ භාවිතා කිරීම
3. කෘෂිකාර්මික භෝග පිරිසිදු කිරීම සහ ගල් ඉවත් කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් සකස් කිරීම
4. ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල වගා කරනු ලබන සමහර ජනප්‍රිය එළවලු වර්ගවල බර ලෝහ අපවිත්‍රනය පිළිබඳ ඇස්තමේන්තු කිරීම
5. දේශීයව පවතින ආර්ථික වටිනාකමක් සහිත එළවලු භෝග සඳහා යෝග්‍ය අඩු උෂ්ණත්ව ගබඩා කිරීමේ තත්ත්වයක් පිළිබඳව ඇගයීම
6. ගොවිපොළ ගබඩා කිරීමේදී වීවල පසු අස්වනු බර අඩු වීම හා ගුණාත්මකභාවය පිරිහීම නිශ්චය කිරීම
7. හදිසි තත්ත්ව යටතේ තෙත් වී වියළීම පිළිබඳ අධ්‍යයනය කිරීම
8. ඕසෝන් ජීවාණුහරණය භාවිතා කරමින් කුළුබඩුවල තත්ත්වය වැඩිදියුණු කිරීම
9. තක්කාලි යුෂවල මුළු ඔක්සිකාරක ධාරිතාවය සහ කැරොටිනොයිඩ ජෛව-ප්‍රවේශය මත තාප සැකසීමේ බලපෑම ඇගයීම
10. විවිධ ගබඩා තත්ත්වයන් යටතේ දෙහි භෝගයේ රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම මත පලතුරු ආලේපනයක බලපෑම් තක්සේරු කිරීම

### 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද නව පර්යේෂණ ව්‍යාපෘති

1. ප්ලාස්ටික් බෝතල්වල ගබඩා කර ඇති ආහාරයට ගන්නා තෙල් වර්ගවලට බහුඅවයවක සංක්‍රමණය වීම අනාවරණය කිරීම සහ ප්‍රමාණය මැනීම සඳහා ක්‍රමවේද සකස් කිරීමෙන් ආහාර කර්මාන්තයේදී භාවිතයට ගන්නා තෙල් වර්ගවල ආරක්ෂාව සහතික කිරීම.

2. අමු මිරිස්වල පෙර අස්වනු පසු අස්වනු රෝග පාලනය සඳහා කෘත්‍රිම දිලීර නාශක සඳහා විකල්පයක් ලෙස දහයියාවල අඩංගු සිලිකන් භාවිතා කිරීම.

බාහිර අරමුදල් ලැබූ පර්යේෂණ ව්‍යාපෘති

1. දෙහි (*Citrus aurantifoila* Swingle) ඵලයේ සෘතු ඵල විද්‍යාව, දෙහි ඵලයේ ගුණාත්මකභාවය මත සහ පසු අස්වනු ජීව කාලය මත පෙර අස්වනු පත්‍ර ප්‍රතිකාරවල බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම (NSF /538 ප්‍රදානය යටතේ ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවෙන් අරමුදල් ලැබිණි)

2. දෙහි (*Citrus aurantifoila* Swingle) භෝගයේ පසු අස්වනු ජීව කාලය ඉහළ නැංවීම සඳහා පසු අස්වනු ප්‍රතිකාර සහ ගබඩාකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම (15-154 ප්‍රදානය යටතේ ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවෙන් අරමුදල් ලැබිණි)

පෞද්ගලික අරමුදල් ලැබූ පර්යේෂණ ව්‍යාපෘති

1. පලතුරු ජෙලි සකස් කිරීම සහ විවිධ ගබඩා තත්ත්වයන් යටතේ කල් පිරීමේ කාලය නිශ්චය කිරීම. අංක 31, රිවර් වීව්, වාරියගොඩ, අලව්ව යන ස්ථානයේ පිහිටි සෙරෙන්ඩිබ් ෆ්ලෝරා (පෞද්.) සමාගමෙන් අරමුදල් සැපයිණි.

2. මධ්‍ය පරිමාණ සහල් පිටි නූඩ්ල්ස් සකස් කිරීමේ යන්ත්‍රයක් සකස් කිරීම සහ ප්‍රශස්තිකරණය කිරීම (2016.03.31 - 2017.05.31), අමිල ඉන්ඩස්ට්‍රීස්, නිට්ටඹුව.

3. මධ්‍ය පරිමාණ සහල් පිටි හැලීමේ යන්ත්‍රයක් සකස් කිරීම, දාස අයන් වර්ක්ස්, නාරම්මල.

ශිෂ්‍ය ව්‍යාපෘති

| අංකය | ශිෂ්‍යයා | අධීක්ෂක | පර්යේෂණ මාතෘකාව |
|---|---|---|---|
| 01 | කේ.එම්.ඩී.එන්. රොද්‍රිගෝ මෙය | සී.ආර්.ගුණවර්ධන මහතා | කටු අනෝදා (*AnnonamuricataL.*) ජෑම් සැකසීම සහ එහි සංවේදක, භෞත රසායනික සහ ශාක රසායනික ගුණ |
| 02 | පී.අයි.සසන්කා මෙය | ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මහත්මිය | දෝසි දැමූ පැඟිරි (*Citrus Aurantifolia*) පොතු සහ ඇඹුල් කෙසෙල් (*Musa spp.*) එක් කළ බිස්කට්වල පෝෂණ, ස්වභාවය සහ සංවේදක ගති ලක්ෂණ |
| 03 | ඒ.බී.එෆ්.හස්නා මෙය | ඉංජි. ටී.එම්.ආර්.දිසානායක | වී තැම්බීමේ සහ කෙටීමේ ගුණාත්කභාවය මත දුර අධෝරක්ත කිරණවල බලපෑම |
| 04 | අනුපම විශ්ව ප්‍රභාත් මහතා | ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මහත්මිය | දෙහි ඵලවල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා විවිධ ගබඩාකරණ තත්ත්ව සමඟ ඵලයේ තත්ත්ව සංයෝජනවල බලපෑම |
| 05 | මහේෂිකා හේරත් මෙය | ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක මහත්මිය | අඹ ඵලයේ නාරටිය අවට පොත්ත කළු පැහැ වීම සහ එය පාලනය කළ හැකි ක්‍රමවේද පිළිබඳව අධ්‍යයනය කිරීම |
| 06 | නදීකා ප්‍රේමරත්න මෙය | ඩබ්ලිව්.එම්.සී.බී.වාසල මහතා | සාමාන්‍ය තත්ත්ව යටතේ 1-මෙතිල්සයික්ලොප්‍රොපෙන් භාවිතා කර කැවෙන්ඩිෂ් කෙසෙල් ඉදීම ප්‍රමාද කිරීම |
| 07 | එස්.එම්.ඒ.පී.සිරිවර්ධන මෙය | ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මහත්මිය | *Capsicum annum* L (Hybrid Muriya) සඳහා අඩු උෂ්ණත්ව ගබඩාකරණ තත්ත්ව ඇගයීම සහ ඉටි ආලේපයක් භාවිතා කර කල් තබා ගැනීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම |

## සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති

### 01. විවිධ ගබඩාකරණ තත්ත්ව යටතේ දෙහි භෝගයේ රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම සඳහා පලතුරු ආලේපයක බලපෑම ඇගයීම.

නැවුම් දෙහි ඵලවල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා ශීත කිරීම (13°C, 85% RH), ශූන්‍ය ශක්ති සිසිලන කුටීරය (ZECC) (16-18 °C, 75-80% RH) සහ සාමාන්‍ය තත්ත්ව (30-32 °C, 65-70% RH) සමඟ පසු අස්වනු ආලේප ප්‍රතිකාර වැනි විවිධ ගබඩාකරණ තත්ත්වවල බලපෑම ඇගයීම සඳහා පරීක්ෂණයක් සිදු කරන ලදී. ආලේපන ප්‍රතිකාරය මඟින් නැවුම් දෙහි ඵලවල ගුණාත්මක ගති ලක්ෂණ ඵලදායී ලෙස ආරක්ෂා කරන ලද අතර සාමාන්‍ය, ZECC සහ ශීත ගබඩාකරණ තත්ත්ව යටතේ රාක්ක ජීව කාලය පිළිවෙළින් දින 15, 30 සහ 40ක් දක්වා දීර්ඝ කිරීමට සමත් විය.

ඉටි ප්‍රතිකාරය ආලේප කිරීමෙන් දෙහි භෝගයේ රාක්ක ජීව කාලය දීර්ඝ කළ හැකි බව ප්‍රතිඵලවලින් අනාවරණය විය. ඉටි ප්‍රතිකාරකය යෙදූ දෙහි භෝගයේ රාක්ක ජීව කාලය කාමර උෂ්ණත්වය, ශූන්‍ය ශක්ති සිසිලන කුටීරය සහ ශීත කාමර තත්ත්වයන්හීදී පිළිවෙළින් දින 15, 30 සහ 0ක් විය.




ඉටි ප්‍රතිකාරය මඟින් ගුණාත්මක ගති ලක්ෂණ වැඩිදියුණු කරන අතරම දෙහි භෝගයේ රාක්ක ජීව කාලය දීර්ඝ කර ඇත.

a. ප්‍රතිකාරයකින් තොරව සාමාන්‍ය තත්ත්ව යටතේ ගබඩා කර ඇති දෙහි

b. ඉටි ප්‍රතිකාරයෙන් පසු සාමාන්‍ය තත්ත්ව යටතේ ගබඩා කර ඇති දෙහි

### 2. කෘෂිකාර්මික භෝග පිරිසිදු කිරීම සහ ගල් ඉවත් කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් සකස් කිරීම

මෙනේරි පිරිසිදු කිරීම සහ ගල් ඉවත් කිරීම සඳහා කුටීර වර්ගයේ වී වෙන්කරනයක යෝග්‍යතාවය ඇගයීම මෙම අධ්‍යයනයේදී සිදු කෙරිණි. ස්ථාවර අපද්‍රව්‍ය ප්‍රමාණයක් සමඟ ප්‍රධාන සීරුමාරු කිරීම් දෙකක් සඳහා එනම් වෙන් කිරීමේ මේසයෙහි ආනතිය වෙනස් කිරීමේදී සහ දෝලන වේගය වෙනස් කිරීමේදී මෙනේරි සඳහා පිරිසිදු කිරීමේ කාර්යක්ෂමතාවය, ධාන්‍ය වෙන්කිරීමේ කාර්යක්ෂමතාවය, ප්‍රතිදාන ධාරිතාවය අගයන ලදී. යන්ත්‍රයේ සීරු මාරු කිරීම් වේග මාපකයෙහි 1 වැනි මට්ටමේ සහ ආනති මානයෙහි 3.5 ක මට්ටමක පවතින විට 100%ක පිරිසිදු කිරීමේ කාර්යක්ෂමතාවයක්, 85.59%ක වෙන් කිරීමේ කාර්යක්ෂමතාවයක් සහ පැයට කිලෝග්‍රෑම් 635.9ක යන්ත්‍ර ධාරිතාවයක් ලබා ගැනීමට හැකි විය. එය අනෙකුත් සීරුමාරු කිරීම් හා සැසඳීමේදී වඩාත් හොඳ ප්‍රතිඵලය විය. ඒ අනුව, මෙනේරිවල ගල් ඉවත් කිරීම සඳහා ඉහත සීරු මාරු කිරීම් යටතේ කුටීර වර්ගයේ වී වෙන්කරනයක් යෝග්‍ය බව අවසන් නිගමනය විය.



පිරිසැකසුම් කළ ගල් ඉවත් කිරීමේ යන්ත්‍රය

### 3. හදිසි තත්ත්ව යටතේ තෙත වී වියළීම පිළිබඳ අධ්‍යයනය කිරීම

පසුගිය දශක කිහිපය තුළ වර්ෂාපතන රටාවන් විශාල වශයෙන් වෙනස් වූ අතර ප්‍රධාන වී වගා ප්‍රදේශවල අස්වනු නෙළන කාලයේදී ඇති වන අධික වර්ෂාව හේතුවෙන් විශාල වී අස්වනු ප්‍රමාණයක් හානියට ලක් වේ. වී අස්වනු නෙළන කාලයේදී වර්ෂාව ඇති වීම වී වියළා ගැනීම සඳහා ඉතා අහිතකර ලෙස බලපෑම් ඇති කරනු ලබන බැවින් යාන්ත්‍රික ක්‍රම මඟින් වී වියළා ගැනීම සඳහා වී නිෂ්පාදකයන් යොමු වේ. යාන්ත්‍රික වී වියළීමේ යන්ත්‍රවල ඉන්ධන වශයෙන් බොහෝවිට දහයියා යොදා ගනු ලැබේ. සමහර අවස්ථාවලදී දර භාවිතයට ගනු ලැබේ. නමුත් වර්ෂා දිනවලදී යන්ත්‍ර සඳහා වියළි දර සහ දහයියා සොයා ගැනීම දුෂ්කර වේ. තවද, මහා පරිමාණයේ වී වියළීමේ යන්ත්‍ර පවතින විශාල වී මෝල් පිහිටා ඇත්තේ ක්ෂේත්‍රයෙන් දුර බැහැර ස්ථානවල වේ. වැසි දිනවලදී වී ප්‍රවාහනය කිරීමද දුෂ්කර වන අතර විකල්ප වියළීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය පවතී.

එබැවින්, මෙම ව්‍යාපෘතිය යටතේ විකල්ප වී වියළීමේ ක්‍රමයක් සම්බන්ධයෙන් සොයා බලන ලදී. මෙම ව්‍යාපෘතියේ දී තාප පොම්පයක් සහාය කරගත් තෙතමනය ඉවත් කිරීමේ ක්‍රමවේදයක් යොදාගනු ලැබූ අතර එය සාර්ථක විය. ඉහළ තෙතමනයක් සහිත වී ගබඩා කිරීම හේතුවෙන් ගබඩා කිරීමේදී සිදුවන ගුණාත්මක හා ප්‍රමාණාත්මකව වී හානිය වැළැක්වීම සඳහා දියුණු කරන ලද ක්‍රමවේදය උපකාරී වේ. තවද, පවතින තවත් ප්‍රධාන ගැටලුවක් වන ඒකාබද්ධ අස්වනු නෙළන යන්ත්‍රවලින් නෙළා ගන්නා වැඩි තෙතමනයක් සහිත නැවුම් වී වියළා ගැනීම සඳහාද වැඩිදියුණු කරන ලද ක්‍රමවේදය උපකාර වනු ඇත. උසස් තත්ත්වයේ වී නිෂ්පාදනය කිරීමෙන් ගොවියාගේ ආදායම වැඩි කරනු ලබන අතර, උසස් තත්ත්වයේ වී යොදා ගෙන සහල් සැකසීමේදී වැඩි සහල් ප්‍රමාණයක් ලබා ගත හැකි වනු ඇත. වී අස්වනු නෙළීමක් සිදු නොවන කාලයේදී, තැම්බූ වී වියළීම සහ බඩ ඉරිඟු, පලතුරු, එළවලු වැනි වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන වියළීම සඳහා මෙම යන්ත්‍රය භාවිතා කළ හැකිය.



වැඩිදියුණු කළ වී වියළීමේ යන්ත්‍රය

## 4. ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල වැවෙන ජනප්‍රිය එළවලු භෝග සමහරක බැර ලෝහ අපවිත්‍රනය ඇගයීම

අහිතකර බැර ලෝහවලින් තොර සුරක්ෂිත ආහාර සඳහා මහජන හා අන්තර්ජාතික ඉල්ලුම ඉහළ ගොස් ඇති බැවින්, බැර ලෝහ පිළිගත හැකි මට්ටම්වලින් කළමනාකරණය කිරීම සඳහා වන ජාතික සහ ජාත්‍යන්තර කැපවීම් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කර ඇත. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් මහජන සහ ජාත්‍යන්තර ඉල්ලුම වැඩිවීම නිසා විශේෂයෙන් විවිධ රටවලින් ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍යවල ඇති බැර ලෝහ වැනි අන්තරායකර අපද්‍රව්‍ය හඳුනාගැනීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් යුරෝපීය රටවල් වැනි වෙනත් රටවල ක්‍රියාත්මක වන ආහාර සුරක්ෂිතතා ප්‍රමිතිවලින් තොරව ආහාර ද්‍රව්‍ය විශාල සංඛ්‍යාවක් ආනයනය කිරීමට දේශීය ආනයනකරුවන් පෙලඹී ඇත. තෝරාගත් ප්‍රධාන බැර ලෝහ 04ක් (As, Pb, Cd සහ Cu) සඳහා ආනයනය කරන ලද (ඇපල්, දොඩම්, මිදි, රතු ලූනු, ලොකු ලූනු, අර්තාපල් සහ මිරිස්) සහ දේශීයව නිෂ්පාදනය කරන ලද පලතුරු සහ එළවලු නියැදි එකතු කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා මෙම පර්යේෂණ අධ්‍යයනය සිදු කරන ලදී. පහත සඳහන් ස්ථානවලින් නියැදි එක්රැස් කරන ලදී.



පඅතාආ හි පර්යේෂණ නිලධාරියෙකු විසින් බැර ලෝහ අපද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම සඳහා මිදි ගොවියෙකුගෙන් නියැදි ලබා ගැනීම, යාපනය දිනය: 2017.05.18

- ආනයනය කළ භාණ්ඩ: ශ්‍රී ලංකා රේගු විමර්ශන ස්ථානයෙන් - RCT ඔරුගොඩවත්ත, ශ්‍රී ලංකාව.
- දේශීයව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ: ශ්‍රී ලංකාවේ දේශීය ගොවීන්, අස්වනු නෙළන ගොවීන් සහ දේශීය වෙළෙඳපොළවලින්

පරීක්ෂණ වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. පරීක්ෂණයට ලක් වූ සමහර නියැදිවල බැර ලෝහවල (As, Pb, Cd සහ Cu) ඉහළ ප්‍රමාණවලින් අඩංගු වන බව සොයාගෙන ඇත. ආහාර සමඟ විෂ ද්‍රව්‍ය මිශ්‍ර වීම සහ සෞඛ්‍ය අවදානම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා සහ නිවැරදි තීරණ ගැනීමට/එම ආහාර ද්‍රව්‍යවලට විෂ මිශ්‍ර වීම පාලනය කිරීම සඳහා යම් නීතිමය ක්‍රියාමාර්ග හඳුන්වාදීම සඳහා රජයට බලපෑම් කිරීමටද මෙම පර්යේෂණයේ සොයා ගැනීම් භාවිතා කළ හැකිය.

## 5. ගොවිපොළ ගබඩා කිරීමේදී වීවල පසු අස්වනු බර අඩුවීම සහ ගුණාත්මකභාවය හානි වීම නිශ්චය කිරීම

ධාන්‍ය පිළිබඳ පෙර පර්යේෂණ අධ්‍යයනයන්ට අනුව, ධාන්‍යවල පසු අස්වනු හානිය ආසන්න වශයෙන් 10-13%ක් එනම් මෙට්‍රික් ටොන් 420,000කට/රු.මි. 3780කට සමාන වේ. කෙසේවෙතත්, වැඩිදියුණු කළ පසු අස්වනු ක්‍රමවේද භාවිතයෙන් පවතින මෙම දත්තවල වෙනස්වීමක් තිබිය හැකි අතර, ධාන්‍යවල පසු අස්වනු හානිය පිළිබඳ වත්මන් තත්ත්වය විශ්ලේෂණය කිරීම හදිසි අවශ්‍යතාවයකි. මෙම පසුබිම් යටතේ ගොවිපොළ ගබඩාව තුළදී වී අස්වැන්නෙහි පසු අස්වනු හානිය ඇගයීම සඳහා මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කරන ලදී. ගබඩා කර තැබීමේදී පසු අස්වනු හානිය 6%ක් ව බව ප්‍රතිඵලවලින් අනාවරණය විය. හානිය සඳහා ප්‍රධාන හේතුව කෘමි හානි ලෙස හඳුනාගෙන ඇත.

## 6. දෙහි භෝගයේ ඍතු ඵල විද්‍යාව සහ ඵලයෙහි ගුණාත්මකභාවය සහ පසු අස්වනු ජීව කාලය මත පෙර අස්වනු වර්ධන නියාමක පත්‍ර ප්‍රතිකාරවල බලපෑම විමර්ශනය කිරීම

දේශීය සූපවේදය, ආහාර සැකසුම් කර්මාන්තය හා දේශීය වෛද්‍ය විද්‍යාවේ ඖෂධයක් ලෙස නැවුම් දෙහි (*Citrus aurantifolia* Swingle) සඳහා වර්ෂය පුරා අඛණ්ඩ ඉල්ලුමක් පවතී. එබැවින්, පසු අස්වනු තාක්ෂණය හා අගය එකතු කිරීම පිළිබඳ ජාතික කමිටුව විසින් එය ඉහළ ප්‍රමුඛතා භෝගයක් ලෙස හඳුනාගෙන ඇත. අවාරයේදී දෙහි කිලෝග්‍රෑම් එකක මිල පාරිභෝගිකයන්ට දරා ගත නොහැකි මට්ටමකට (ශ්‍රීලරු.600-1000) ඉහළ යයි. අනික් අතට, උපරිම අස්වැන්නක් ලැබෙන කාලයේදී නිෂ්පාදන පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත් මිලක් නොලැබීමෙන් වගාකරුවන් විසින් අස්වැන්නක් නෙළීමක් නොකරන තත්ත්වයකට පත් වේ. කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ දැනට ජාතික මට්ටමෙන් මෙම භෝගයේ පෙර සහ පසු අස්වනු ගැටලු විසඳීම සඳහා විධිමත් පර්යේෂණ සිදු කර නොමැති බැවින් තාක්ෂණය තවමත් ළදරු අවධියක පවතී. එබැවින් යෝජිත පර්යේෂණයේ අරමුණ වූයේ භෝගයේ ඍතු ඵල විද්‍යාව, පරිණත වීම සහ වැඩසටහන්ගත වර්ෂය පුරා අලෙවිකරණයක් සඳහා අස්වනු නෙළන වාරය මෙහෙයවීම අධ්‍යයනය කිරීමයි. ව්‍යාපෘතියේ පළමු අදියර මේ වනවිට නිම කර ඇති අතර දෙහි ඵලයේ වර්ධන අවස්ථා 16, විකසනය සහ කල්පිරීම (ඍතු ඵල විද්‍යාව) හඳුනාගෙන තිබේ. ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ භාවිතා කිරීම පිණිස ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් අතර බෙදා හැරීම සඳහා වර්ණ ප්‍රස්තාර සහ ප්‍රමාණකරණ මුදු සකස් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලැබිණි.




දෙහි ඵලයේ (*C. aurantifolia*) ඍතු ඵල විද්‍යා අවධි 19 ක වෙනස්වීම් (ඵලය හටගැනීමෙන් 14,28, ආදී වූ දිනවලින් පසු)

# සංවර්ධන ව්‍යාපෘති හරහා තාක්ෂණ පැවරීමේ ක්‍රියාකාරකම්

තාක්ෂණය යොදා ගැනීම සහතික කිරීම සඳහා 2017 වර්ෂය තුළදී පඅතාආ විසින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහ පසු අස්වනු කර්මාන්තයට ඒවායේ බලපෑම පහත විස්තර කර ඇත. නිෂ්පාදනය වැඩි කිරීම, අපනයන වෙළෙඳපොළ ගවේෂණය කිරීම, කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම උදෙසා ජාතික ප්‍රමුඛතාවන් ඉලක්ක කර ඇති තත්ත්වයක් තුළ පසු අස්වනු තාක්ෂණය ජාතික විෂය පථයේ වැඩි ප්‍රමුඛතාවයක් සහිත ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත. මෙම සන්දර්භය තුළ, පසු අස්වනු හානි අවම කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් පසු අස්වනු ක්ෂේත්‍රයේ ගැටලු නිරාකරණය කිරීම සඳහා පඅතාආ විසින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. තවද, රට පුරා කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම මෙම සංවර්ධන ව්‍යාපෘතිවල අරමුණ විය.

2017 වර්ෂය තුළ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද ඵලදායි ලෙස ව්‍යාප්ත කිරීම සඳහා දිවයින පුරා සංවර්ධන ව්‍යාපෘති 08ක් ක්‍රියාත්මක කරන ලද අතර 'ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන' යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා දී ඇත. 2017 වර්ෂය තුළ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ලැබුණු මුළු අරමුදල රු.මි. 70.4 කි. එම සංවර්ධන ව්‍යාපෘති පහත පරිදි වේ;

a. ශ්‍රී ලංකාවේ අඹවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම
b. ශ්‍රී ලංකාවේ පේරවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම
c. ශ්‍රී ලංකාවේ ගස්ලබුවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම
d. ශ්‍රී ලංකාවේ කෙසෙල්වල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම
e. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණය කිරීම
f. ආර්ථික වශයෙන් වැදගත් ආහාර ද්‍රව්‍යවල බැර ලෝහ අපවිත්‍රනය නිශ්චය කිරීම
g. කාබනික ක්‍රමවේද මඟින් පලතුරු ඉදවීම ප්‍රේරණය කිරීම
h. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ආයතනවලදී කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු හානි අඩු කිරීම පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කිරීම

මෙම ව්‍යාපෘති 8න් අවසානයට සඳහන් කර ඇති සංවර්ධන ව්‍යාපෘතිය 2017 වර්ෂය තුළදී අවසන් කර ඇති අතර අනෙක් ව්‍යාපෘති 7, 2018 වර්ෂයේදීද සිදු කරගෙන ගොස් ඇත.

## a. ශ්‍රී ලංකාවේ අඹවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම

එහි ඉහළ රසය සහ පෝෂණ වටිනාකම හේතුවෙන් වාණිජ වගාවක් ලෙස අඹ නිවාස උද්‍යානවල බහුලව වගා කරනු ලැබේ. දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් රසවත් අඹ සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. එහෙත් අවිධිමත් පසු අස්වනු භාවිතයන් හේතුවෙන් අඹ ඵලයේ තත්ත්වය බාල වීම සහ ඉහළ පසු අස්වනු හානි හේතුවෙන් කර්මාන්තය විශාල ගැටලුවකට මුහුණපා ඇත. මෙමඟින් අඹ කර්මාන්තය එහි පාරිභෝගිකයන්ට ලබා දෙනු ලබන ප්‍රතිලාභ සීමා වීමක් සහ අඹ කර්මාන්තය හා සම්බන්ධ අනෙකුත් සියලු ප්‍රතිලාභීන්ගේ ලාභය අඩු වීමෙන් වෙළෙඳපොළ මිල ඉහළ නැංවීම සහ පලතුරු වල ගුණාත්මකභාවය අඩු කිරීම සඳහා හේතු වී ඇත.

මෙම ගැටලු විසඳා ගැනීම සඳහා 2016 වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘතියක් පවත්වා ඇති අතර එය 2017 වර්ෂය දක්වාද ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතියට අඹ සැපයුම් සහ වටිනාකම් දාම වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළත් වේ. ප්‍රධාන වශයෙන් මූලික සමීක්ෂණයක්, පුහුණු කිරීම් සහ දිවයින පුරා හැසිරවීමේ සහ සැකසීමේ ඒකක ස්ථාපිත කිරීම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරිණි.

මෙම ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකම වන්නේ සියලුම යෝග්‍ය පසු අස්වනු තාක්ෂණයන් භාවිතා කරනු ලබන සහ උසස් තත්ත්වයේ අඹ අලෙවි කරනු ලබන අඹ සැකසුම් කලාප ස්ථාපිත කිරීම වේ. හඳුන්වා දුන් තාක්ෂණයන්ට අස්වනු නෙළීම, හැසිරවීම සහ ඇසුරුම් කිරීම, ඉදවීම, වෙළෙඳනාම සහ අලෙවිකරණ උපාය මාර්ගද ඇතුළත් වේ.

2017 වර්ෂයේදී අඹ හැසිරවීමේ සහ ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථාන 11ක් සමඟින් ඔමාරගොල්ල (කුරුණෑගල දිස්ත්‍රික්කය) සහ පේරාදෙණිය (මහනුවර දිස්ත්‍රික්කය) අඹ සැකසීමේ කලාප 2ක් ස්ථාපනය කරන ලදී. අනිකුත් කලාප 06 ක් ස්ථාපනය කිරීම සඳහා සියලු මූලික ක්‍රියාකාරකම් ද අවසන් කර ඇති අතර 2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී ස්ථාපිත කිරීමට නියමිතය. "ඔමාරගොල්ල අඹ" සහ "පේරාදෙණිය අඹ" යන වෙළෙඳ නාම දෙක යටතේ උසස් තත්ත්වයේ අඹ, දැන් අලෙවිය සඳහා ඇත. පාරිභෝගිකයන් හා වෙළෙඳුන් අතර මෙම වෙළෙඳ නාම දෙක සඳහා ඉහළ ඉල්ලුමක් නිරීක්ෂණය කෙරිණි. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂය දක්වාද ක්‍රියාත්මක වේ.



**පේරාදෙණිය අඹ සැකසුම් කලාපය විවෘත කිරීමේ දිනය: 09.10.2017**

**වම -**බී. විජේරත්න මහතා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, ආචාර්ය රොහාන් විජේකෝන්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සහ පඅතාආ සභාපතිවරයා සහ වෙනත් නිලධාරීන් සමග සම්භාවනීය අමුත්තන්

**දකුණ-** ‘පේරාදෙණිය අඹ’ යන වෙළෙඳ නාමය යටතේ වෙළෙඳපොළට යැවීමට සූදානම් කර ඇති අඹ අමාත්‍යාංශ ලේකම් බී.විජේරත්න මහතා විසින් පරීක්ෂා කරන ආකාරය

## b. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ආයතනවලදී කෘෂිකාර්මික ආහාර භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කිරීම

අදාළ පාර්ශ්වකරුවන් අතර දැනුම නොමැති වීම, පසු අස්වනු කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා සීමාකාරී සාධකයක් වේ. එබැවින් මෙම ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා දැනුම වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය අංගයකි. ප්‍රතිලාභීන් සඳහා දැනුම ලබා දෙන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ විවිධ ආයතනවල රජයේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයයි. මෙම කටයුත්තට සම්බන්ධ මූලික ආයතන වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවයි. එබැවින් බිම් මට්ටමේ ක්‍රියාත්මක වන නිලධාරීන්ගේ දැනුම වැඩි කිරීම ඉතා වැදගත් සාධකයක් වේ.

එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහායකයන් (කෘපනිස) සඳහා පුහුණුකරන්නන් පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වූවකි. 2017 වර්ෂය තුළදී ආයතනය විසින් පුහුණු වැඩසටහන් 17ක් පවත්වා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහායකයන් 1381 දෙනෙකු පුහුණු කර ඇත.




**පුහුණුකරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්**

**වම** - පඅතාආ ව්‍යාප්ති නිලධාරි එන්. සෝමකාන්තන් මහතා, 2017.02.14 වැනි දින යාපනය දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථනයේදී පසු අස්වනු තාක්ෂණය පිළිබඳව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහායකයන් සඳහා දේශනයන් පවත්වමින්

**දකුණ**- ව්‍යාප්ති නිලධාරි එම්.එම්.හේරත් මහතා සහ පඅතාආ ජී.ඩබ්ලිව්.එස්.පතිරණ මහතා විසින් 2017.03.27 වැනි දින පොතුහැර පිහිටි දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේදී කුරුණෑගල කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහායකයන් සඳහා දේශනයන් පවත්වමින්

## c. කාබනික ක්‍රමවේදයක් භාවිතා කර පලතුරු ඉදීම ප්‍රේරණය කිරීම

වාණිජ නැවුම් පළතුරු කර්මාන්තයේදී භාවිතා කිරීම සඳහා කාබනික පලතුරු ඉදවීමේ ක්‍රමයක් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. බිලින්, කැප්පෙටියා සහ මෙම පත්‍ර වර්ග දෙකෙහි කුඩු මිශ්‍රණයක් එතිලීන් වායු විමෝචනය සඳහා වායු වර්ණලේඛ ශිල්පය භාවිතයෙන් පරීක්ෂණයට ලක් කරන අතර පරීක්ෂණ සිදු කරමින් පවතී.

## d. පේරවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම

පේර යනු වියළි කලාපයේ ප්‍රධාන වශයෙන් වගා කරන නැගී එන පලතුරු වගාවන්ගෙන් එකකි. ශ්‍රී ලංකාවේ දේශගුණික තත්ත්වයන් සහ අනෙකුත් සාධක පේර වගා කිරීම සඳහා බෙහෙවින් යෝග්‍ය වන අතර එමගින් ඉහළ ඵලදාවක්ද ලබා දේ. එහෙත් 30-35% ක් පමණ වන ඉහළ පසු අස්වනු හානිය, අඩු ගුණාත්මකභාවය සහ නුසුදුසු පසු අස්වනු භාවිතයන් යොදා ගැනීම වැනි ඵලයේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු හේතුවෙන් කර්මාන්තයේ ලාභදායීතාවය අඩු වී ඇති අතර ගැටලු සහගත තත්ත්වයකට පත් වී ඇත. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පේර හා සම්බන්ධ සැපයුම් සහ වටිනාකම් දාම ක්‍රියාකාරකම්වලදී යෝග්‍ය පසු අස්වනු භාවිතයන් ප්‍රචලිත කිරීම සඳහා දැනුම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් පේරවල සැපයුම් සහ වටිනාකම් දාමයන්හි සියලු පියවරයන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපෘතිය යටතේ පුහුණු වැඩසටහන් තුනක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් 57ක් පුහුණු කර ඇත. ඉපලෝගම සහ පුලියන්කුලම යන ප්‍රදේශවල පේර සැකසුම් කලාප දෙකක් ස්ථාපිත කිරීමට සූදානමින් සිටින අතර හැසිරවීමේ ඒකක විසි හතක් ආරම්භ කර ඇත. එක් ඒකකයකට වර්ගීකරණ මේසයක්, ඇසුරුම් මේසයක්, ප්ලාස්ටික් ඇසුරුම්, රැලි සහිත පෙට්ටි, ස්ටිකර්, පේර බහාලන මලු, මිල සටහන් කරන යන්ත්‍ර, දින මුද්‍රා සහ පෙරමෝන උගුල් ඇතුළත් වේ. ව්‍යාපෘතිය 2018 දක්වා ක්‍රියාත්මක වේ.





**වම:** පඅතාආ හා විදාතා මධ්‍යස්ථානවල නිලධාරීන් ව්‍යාපෘති ප්‍රතිලාභීන් සමඟ සාකච්ඡා පවත්වමින්

**දකුණ:** 2017.11.08 දින සිදු කළ ක්ෂේත්‍ර සංචාරය. පඅතාආ පර්යේෂණ නිලධාරියා ව්‍යාපෘති ප්‍රතිලාභීන් සමඟ සාකච්ඡා කරමින්.

## ඉ. කෙසෙල්වල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම



රාජාංගනය ප්‍රදේශයේ කෙසෙල් වගාවක සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකාව
දිනය: **2017.09.06**
පඅතාආ පර්යේෂණ නිලධාරීන් සහ ප්‍රතිලාභීන් ඡායාරූපයේ සිටී

වගා කර ඇති භූමි ප්‍රමාණය සහ පරිභෝජනය අතින් ගත් කළ කෙසෙල් ශ්‍රී ලංකාවේ වගා කරන ප්‍රධාන පලතුරු භෝගයයි. ශ්‍රී ලංකාවේ දේශගුණික තත්ත්වයන් හා අනෙකුත් සාධක කෙසෙල් වගා කිරීම සඳහා බෙහෙවින් යෝග්‍ය වන අතර වර්ෂය මුළුල්ලේ ඉහළ ආදායමක් ලබා දෙයි. එහෙත් ඉහළ පසු අස්වනු හානිය, අඩු ගුණාත්මකභාවය සහ නුසුදුසු පසු අස්වනු භාවිතයන් යොදා ගැනීම වැනි ඵලයේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු හේතුවෙන් කර්මාන්තයේ ලාභදායීතාවය අඩු වී ඇති අතර ගැටලු සහගත තත්ත්වයකට පත් වී ඇත. වාර්ෂික කෙසෙල් නිෂ්පාදනය ආසන්න වශයෙන් කැන් මිලියන 3.3ක් පමණ වේ. වාර්ෂිකව ප්‍රමාණාත්මක පසු අස්වනු හානිය 30%ක් වන අතර එය වර්ෂයකට කැන් මිලියන 0.99ක් පමණ වේ. මෙයින් අදහස් කරන්නේ සෑම වර්ෂයකම රුපියල් බිලියන 1ක් පමණ වටිනා කෙසෙල් ප්‍රමාණයක් අපතේ යන බවයි.

ඒ අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් හා සම්බන්ධ සැපයුම් සහ වටිනාකම් දාම ක්‍රියාකාරකම්වලදී යෝග්‍ය පසු අස්වනු භාවිතයන් ප්‍රචලිත කිරීම සඳහා දැනුම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් කෙසෙල්වල සැපයුම් සහ වටිනාකම් දාමයන්හි සියලු පියවරයන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ එක් පුහුණු වැඩසටහනක් පවත්වන අතර ප්‍රතිලාභීන් 21ක් පුහුණු කර ඇත. රාජාංගනය ප්‍රදේශයේ එක් කෙසෙල් සැකසුම් කලාපයක් ස්ථාපිත කිරීමට සූදානමින් සිටින අතර හැසිරවීමේ ඒකක 12ක් ආරම්භ කරනු ඇත. එක් ඒකකයකට ඉදවීමේ කුටීරයක්, වර්ගීකරණ මේසයක්, ඇසුරුම් මේසයක්, ප්ලාස්ටික්

ඇසුරුම්, රැලි සහිත පෙට්ටි, ස්ටිකර්, මිල සටහන් කරන යන්ත්‍ර, දින මුද්‍රා සහ ස්ටයිරොෆෝම් තුනී තහඩු ඇතුළත් වේ.

## f. ගස්ලබුවල සැපයුම් සහ වටිනාකම් දාම කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම



2017.09.28 වැනි දින තඹුත්තේගම පැවති ගස්ලබු නියමු ව්‍යාපෘතිය හඳුන්වාදීමේ දේශනය පඅතාආ නිලධාරින් අඹ ව්‍යාපෘතියේ සාර්ථකභාවය සම්බන්ධයෙන් ගස්ලබු එක්රැස් කරන්නන් කණ්ඩායමකට පැහැදිලි කරමින්

ගස්ලබු ප්‍රධාන වශයෙන් වියළි කලාපයේ වගා කර ඇති ප්‍රධාන පලතුරු භෝගයකි. ශ්‍රී ලංකාවේ දේශගුණික තත්ත්වයන් හා අනෙකුත් සාධක කෙසෙල් වගා කිරීම සඳහා බෙහෙවින් යෝග්‍ය වන අතර වර්ෂය මුළුල්ලේ ඉහළ ආදායමක් ලබා දෙයි. කෙසේවෙතත්, පාරම්පරික සැපයුම් දාමයේදී සිදු වන ඉහළ පසු අස්වනු හානිය සහ නුසුදුසු පසු අස්වනු භාවිතයන් යොදා ගැනීම හේතුවෙන් ගුණාත්මකභාවය අඩුවීම වැනි කරුණු හේතුවෙන් කර්මාන්තයේ ලාභදායීතාවය අඩු වී ඇති අතර ගැටලු සහගත තත්ත්වයකට පත් වී ඇත. වාර්ෂික ගස්ලබු නිෂ්පාදනය ආසන්න වශයෙන් ගෙඩි මිලියන 26ක් පමණ වේ. වාර්ෂිකව ප්‍රමාණාත්මක පසු අස්වනු හානිය 46%ක් වන අතර එය වර්ෂයකට ගෙඩි මිලියන 11ක් පමණ වේ. මෙයින් අදහස් කරන්නේ සෑම වර්ෂයකම රුපියල් මිලියන 300ක් පමණ වටිනා ගස්ලබු ප්‍රමාණයක් අපතේ යන බවයි.

ඒ අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගස්ලබු හා සම්බන්ධ සැපයුම් සහ වටිනාකම් දාම ක්‍රියාරකම්වලදී යෝග්‍ය පසු අස්වනු භාවිතයන් ප්‍රචලිත කිරීම සඳහා දැනුම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ගස්ලබුවල සැපයුම් සහ වටිනාකම් දාමයන්හි සියලු පියවරයන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන අතර ප්‍රතිලාභීන් 26ක් පුහුණු කර ඇත. රාජාංගනය ප්‍රදේශයේ එක් ගස්ලබු සැකසුම් කලාපයක් ස්ථාපිත කරන ලද අතර හැසිරවීමේ ඒකක 12ක් ආරම්භ කරන ලදී. එක් ඒකකයකට ඉදවීමේ කුටීරයක්, වර්ගීකරණ මේසයක්, ඇසුරුම් මේසයක්, ප්ලාස්ටික් ඇසුරුම්, රැලි සහිත පෙට්ටි, ස්ටිකර්, මිල සටහන් කරන යන්ත්‍ර, දින මුද්‍රා සහ ස්ටයිරොෆෝම් තුනී තහඩු ඇතුළත් වේ.

## g. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් සහ වටිනාකම් දාමය කළමනාකරණය කිරීම

කල් තබා ගත නොහැකි ද්‍රව්‍යවල වටිනාකම දාමය ඔස්සේ මිල උච්චාවචනය වීම කර්මාන්තය තුළ ප්‍රධාන ගැටලුවලින් එකකි. අස්වැන්න නෙළීමේ කාලය තුළ ප්‍රධාන වශයෙන් ධාන්‍ය හා කල් තබා ගත නොහැකි ද්‍රව්‍යවල මිල, අතිරික්ත සැපයුම හේතුවෙන් අවම මිලටත් වඩා පහත වැටේ. එසේම වැඩි පසු අස්වනු හානියකට හේතු වන සැපයුම් දාමය පුළුල් වීම කෘෂිකාර්මික නිෂ්පාදනවල අඩු ගුණාත්මක භාවයට හේතු වී තිබේ. කෘෂිකාර්මික නිෂ්පාදනවල දුර්වල බෙදාහැරීම හේතුවෙන් වාරයේදී අතිරික්තයක් හා අනෙක් කාල පරිච්ඡේදය තුළ හිඟයක් ඇති වීමද කර්මාන්තයේ ඇති තවත් ගැටලුවකි. බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම හා සම්බන්ධීකරණය කිරීමෙන් කර්මාන්තයේ බොහෝ ගැටලු විසඳිය හැකිය. එබැවින් ශ්‍රී ලංකාව තුළ කල් තබා ගත නොහැකි ද්‍රව්‍යවල සැපයුම් දාමය ප්‍රතිසංවිධානය කිරීම ආරම්භ කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. ආරම්භයේදී, භෝග නිෂ්පාදනය සහ පරිභෝජනය සම්බන්ධ ද්විතියික දත්ත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, HARTI වැනි රජයේ ආයතනවලින් එකතු කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ භෝග නිෂ්පාදන දත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංගණන හා සංඛ්‍යාලේඛන අංශයන්ගෙන් එකතු කරන ලදී.

තවද, ප්‍රශ්නාවලි පොත් පිංචක් මගින් APRA මට්ටම්වල අස්වනු නිෂ්පාදන දත්ත ලබා ගන්නා ලදී. දිවයින පුරා සැපයුම් දාම 10ක් ඔස්සේ එළවලු 12ක සහ පලතුරු 3ක; තක්කාලි, බටු, කැරට්, බෝංචි, මෑ කරල්, බණ්ඩක්කා,

පතෝල, කරවිල, පිපිඤ්ඤා, බීට්, ලීක්ස්, අමු මිරිස්, ගස්ලබු, කෙසෙල් සහ පේරවල පසු අස්වනු බර අඩු වීම අධ්‍යයනය කරන ලදී. ප්‍රතිසංවිධානය කරන ලද සැපයුම් දාමය ඔස්සේ නිෂ්පාදන බෙදාහැරීම අධීක්ෂණය කිරීම සඳහා GPS උපකරණ සහ උෂ්ණත්ව දත්ත මාන 100 ක් මිලදී ගන්නා ලදී.







C

ඵලවලු හානි ඇගයීම් අධ්‍යයනය

**A.** සිල්ලර වෙළෙඳාම සිදු කරන ස්ථානයේදී පසු අස්වනු හානිය පිළිබඳ ප්‍රශ්නාවලියක් පිරවීම

**B.** ප්‍රවාහනය කිරීමේදී සිදු වන යාන්ත්‍රික හානි විමර්ශනය කිරීම

**C.** ක්ෂේත්‍රයේදී හානි ඇගයීම් ක්‍රියාකාරකම් සිදු කිරීම

## ව්‍යාප්තිය

ව්‍යාප්ති අංශය රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය වෙමින් දිවයින පුරා ඇති එහි ව්‍යාප්ති මධ්‍යස්ථාන හරහා සිය තාක්ෂණ ව්‍යාප්ත කිරීම් කටයුතු සිදු කරයි. 2017 වර්ෂය තුළ දී ආයතනයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් එකක් වන ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්ති කටයුතු හරහා තාක්ෂණ ව්‍යාප්ත කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ නව ව්‍යාප්ති මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී.

භෝග වගා කරන ප්‍රධාන ප්‍රදේශවල පිහිටි පහත සඳහන් පසු අස්වනු තාක්ෂණ මධ්‍යස්ථාන අටකින් දිවයින පුරා ව්‍යාප්ති ජාලය සමන්විත වේ:

1. අනුරාධපුරය (අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය ආවරණය කිරීම)
2. අඹන්පොල (කුරුණෑගල, පුත්තලම, ගම්පහ ආවරණය කිරීම)
3. මහනුවර (මහනුවර, මාතලේ, කෑගල්ල ආවරණය කිරීම)
4. නුවරඑළිය (නුවරඑළිය, වැලිමඩ ආවරණය කිරීම)
5. අම්පාර (අම්පාර, මොණරාගල, මඩකලපුවෙහි කොටසක්, මහවැලි සී කලාපය ආවරණය කිරීම)
6. හම්බන්තොට (හම්බන්තොට, මාතර, ගාල්ල, ඇඹිලිපිටිය ආවරණය කිරීම)
7. කිලිනොච්චිය (කිලිනොච්චිය, වව්නියාව, මුලතිව්, යාපනය, මන්නාරම ආවරණය කිරීම)
8. කොළඹ (කොළඹ, ගම්පහ, කළුතර ආවරණය කරමින්) –නව ව්‍යාප්ති මධ්‍යස්ථානය

**තාක්ෂණ පැවරීම් කටයුතු සඳහා තෝරාගත් විවිධ ප්‍රධාන අංශ**

a) කෘෂි භෝගවල පසු අස්වනු හානිය අවම කිරීම

b) ගබඩාකරණ ක්‍රම සඳහා තාක්ෂණය හඳුන්වාදීම

c) සහල්, මාෂ භෝග සහ අනෙකුත් ධාන්‍ය සැකසීම

d) කුළුබඩු සැකසීම

e) පලතුරු සහ එළවලු සඳහා අගය එකතු කිරීම

f) සහල් සහ මාෂ භෝග ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය

g) ශ්‍රී ලංකාවේ මානව පෝෂණය හා ආහාර පුරුදු පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන්




වර්තමානයේ දිවයින පුරා තාක්ෂණ පැවරීම් කටයුතු ව්‍යාප්ති මධ්‍යස්ථාන 7ක් මඟින් ආවරණය වේ.

කෘෂි ව්‍යාප්ති කටයුතු (කෘෂිකාර්මික උපදේශන සේවා ලෙසද හැඳින්වේ) කෘෂි ඵලදායිතාව ඉහළ නැංවීම, ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම, ග්‍රාමීය ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ දිළිදු පුද්ගලයන්ගේ ආර්ථිකය වර්ධනය කිරීම යන අංශවල ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි

සමාලෝචිත වර්ෂය තුළදී ගොවීන්, එක්රැස් කරන්නන්, සකස් කරන්නන්, වෙළෙන්දන්, රාජ්‍ය සහ පෞද්ගලික අංශ ව්‍යාප්ති නිලධාරින්, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, පාසල් සහ වෙනත් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන් ඉලක්ක කර ගනිමින් ව්‍යාප්ති ක්‍රියාකාරකම් රාශියක් සිදු කර ඇත.

ව්‍යාප්ති වැඩසටහන යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් අතරින් එකක් වන්නේ පුහුණු වැඩසටහන් සිදු කිරීමයි. මෙම පුහුණු වැඩසටහන් සෑම වර්ෂයකම ආයතනය විසින් සිදු කරනු ලැබේ. පඅතාආ හි පුහුණු ක්‍රියාකාරකම්, ධාන්‍ය, අල සහ බතල, පලතුරු සහ එළවලුවල පසු අස්වනු තාක්ෂණය පිළිබඳව රාජ්‍ය සහ පෞද්ගලික අංශ ආයතනවල නිෂ්පාදකයන්, සැකසුම්කරුවන්, වෙළෙන්දන් සහ සේවකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීම ඉලක්ක කර ගනිමින් සිදු කරන ලදී.

## පුහුණුව

පුහුණු වැඩසටහන් සඳහා මතු දැක්වෙන උපාය මාර්ගයන් අනුගමනය කරන ලදී; නේවාසික පුහුණු වැඩසටහන් ලෙස හැඳින්වෙන ආයතනය තුළ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සහ ක්ෂේත්‍රයේ පවත්වන වැඩසටහන් ලෙසිනි. මෙම වැඩසටහන් සියල්ලම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවය මත පදනම් වූ අතර පුහුණු කරනු ලබන ප්‍රතිලාභීන්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලනු ඇත.

i. නේවාසික පුහුණු වැඩසටහන්
ii. අනේවාසික පුහුණු වැඩසටහන්

## නේවාසික පුහුණු වැඩසටහන්

මෙම පුහුණු වැඩසටහන් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. 2017 වර්ෂය තුළදී කෙටි කාලීන නේවාසික පුහුණු පාඨමාලා 61ක් පැවැත්වූ අතර පුද්ගලනේ 2036 දෙනෙකු පසු අස්වනු තාක්ෂණයෙහි විවිධ විෂයන්හි පුහුණු කර ඇත. විස්තර 1 රූපයෙහි දැක්වේ.




2017 වර්ෂයේදී පඅතාආ නේවාසික පුහුණුවන්නන්

පුහුණු වැඩසටහන්, කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් සහ වටිනාකම් දාමයන්හි සියලු පාර්ශ්වකරුවන් ඉලක්ක කරගෙන පවත්වන ලදී. මෙම පාර්ශ්වකරුවන් ප්‍රධාන වශයෙන්, ගොවීන්/ගෙවිලියන්, එක්රැස් කරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන් සහ සකස් කරන්නන් විය. තවද මෙම වැඩසටහන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරින්, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ පාසල් ශිෂ්‍යයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම යටතේ පවත්වා ඇත. මෙම වැඩසටහන් මඟින් පසු අස්වනු තාක්ෂණ, ව්‍යවසාය සංවර්ධනය, හානි අඩු කිරීම, ක්‍රියාවලි සහ තත්ත්වය වැඩිදියුණු කිරීම, පසු අස්වනු යන්ත්‍රසූත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ආදිය පිළිබඳව පිළිබඳ දැනුම්වත්භාවය ඇති කිරීම ඉලක්ක කර ඇත.

| කාණ්ඩය | විස්තරය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| A | ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් | 02 | 50 |
| B | ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් | 20 | 478 |
| D | රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් | 09 | 256 |
| E | ද්විතියික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් | 30 | 1281 |
| | **එකතුව** | **61** | **2036** |

## අනේවාසික/ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්

මෙම වැඩසටහන් ක්ෂේත්‍රයේදීම සිදු කෙරේ. මෙම පුහුණු කිරීම් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ පඅතාආ හි ව්‍යාප්ති මධ්‍යස්ථාන මඟින් පවත්වනු ලැබේ. 2017 වර්ෂය තුළදී ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සහ ඉදිරිපත් කිරීම් 110ක් පවත්වා ඇති අතර 2962 දෙනෙකු පුහුණු කර ඇත.

ප්‍රධාන වශයෙන්, ගොවීන්/ගෙවිලියන්, එක්රැස් කරන්නන්, ප්‍රවාහනය කරන්නන්, තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන් සහ සකස් කරන්නන් ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් සහ වටිනාකම්

ග්‍රාමයන්හි සියලු පාර්ශ්වකරුවන් උදෙසා පවත්වන ලදී. මෙම වැඩසටහන් මඟින් පසු අස්වනු තාක්ෂණ, ව්‍යවසාය සංවර්ධනය, හානි අඩු කිරීම, ක්‍රියාවලි සහ තත්ත්වය වැඩිදියුණු කිරීම, පසු අස්වනු යන්ත්‍රසූත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ආදිය පිළිබඳව දැනුම්වත්භාවය ඇති කිරීම ආවරණය කරන ලදී.




2017 වර්ෂයේ පවත්වන ලද ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්වල පුහුණුවන්නන් වර්ගීකරණය

| කාණ්ඩය | විස්තරය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| A | ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් | 70 | 1690 |
| B | ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් | 18 | 454 |
| C | කෘෂි නිෂ්පාදන එක්රැස් කරන්නන්, ප්‍රවාහනය කරන්නන් සහ වෙළෙන්දන් | 07 | 228 |
| D | කෘෂි නිෂ්පාදන සකස් කරන්නන් | 03 | 18 |
| E | රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරීන් | 09 | 294 |
| F | ද්විතියික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් | 02 | 253 |
| G | බේකරි හිමියන් | 01 | 18 |
| | එකතුව | **110** | **2962** |

මෙම ප්‍රතිලාභීන් බොහොමයක් මෙම පුහුණු වැඩසටහන්වලින් ලබා දෙන ලද තාක්ෂණයන් භාවිතා කරමින් සිටී. අත්පත් කර ගනු ලැබූ තාක්ෂණික දැනුම තුළින්, දැනුම වැඩිදියුණු කර ගැනීම, නිෂ්පාදනයෙහි තත්ත්වය ඉහළ නංවා ගැනීම, ආදායම් උත්පාදනය, ග්‍රාමීය සවිබලගැන්වීම සහ වෙනත් බොහොමයක් ප්‍රතිලාභ අත්පත් කරගෙන ඇත. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ජාතික සංවර්ධනයෙහි එක් ප්‍රධාන සීමාකාරී සාධකයක් වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ හානි අඩු කිරීම සහ තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෙය සෘජුවම දායකත්වය ලබා දෙනු ලැබේ. තවද එය වැඩිදියුණු කළ ජීවන තත්ත්වයන් සමඟ කර්මාන්තමය සංවර්ධනය, ආර්ථික සංවර්ධනය සහ සමාජීය සංවර්ධනය සඳහාද දායකත්වය ලබා දී ඇත. මෙම වැඩසටහන් යටතේ ඔවුන්ගේ කර්මාන්ත ආරම්භ කරන ලද /වැඩිදියුණු කර ගන්නා ලද ප්‍රතිලාභීන් කිහිප දෙනෙකු පහත ලැයිස්තුගත කර ඇත.

| අංකය | නම | ලිපිනය | භාවිතා කළ තාක්ෂණය |
|---|---|---|---|
| | ප්‍රාදේශීය ආර්ථිකය ඉහළ නැංවීමේ ව්‍යාපෘති 1 -මාතලේ | 49,354.70 | 49,354.70 |
| | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 30,940.67 | 30,940.67 |
| | මහවැලිය සඳහා ලැබිය යුතු මුදල් | 5,04,800.00 | 5,04,800.00 |
| | NSF සඳහා ලැබිය යුතු මුදල් | - | 93,056.77 |
| | අම්පාර සඳහා ලැබිය යුතු මුදල් | - | 97,396.29 |
| | - TOT සඳහා ලැබිය යුතු මුදල් | 1,13,400.00 | |
| | - සැපයුම් සහ වටිනාකම් දාම සඳහා ලැබිය යුතු මුදල් | 1,76,832.00 | |
| | - අඹ ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 1,73,91,408.28 | |
| | - කාබනික ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 54,07,920.00 | |
| | - පේර ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 71,72,371.71 | |
| | - ගස්ලබු ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 40,27,194.90 | |
| | - කෙසෙල් ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 35,44,880.70 | |
| | - අමු මිරිස් ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 52,785.00 | |
| | - ආහාරයට ගන්නා තෙල් ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුද | 3,35,908.65 | |
| | - බැර ලෝහ ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු මුදල් | 53,50,000.00 | |
| | - වප් මඟුල් උත්සවය සඳහා ලැබිය යුතු මුදල් | 22,78,360.00 | |
| | | **4,84,29,997.89** | **21,20,432.87** |

| | | | 2017 | 2016 |
|---|---|---|---|---|
| | | | (රු.) | (රු.) |
| 12 | **බඩු වට්ටෝරු** | | | |
| | නූඩ්ල්ස් | | 29,246.40 | 31,277.40 |
| | සහල් මෝල -සහල් | | 1,606.50 | 1,606.50 |
| | ගබඩා-වී | | 34,119.62 | 34,119.62 |
| | පර්යේෂණ ව්‍යාපෘති | | 1,01,500.00 | 2,94,968.00 |
| | යන්ත්‍රසූත්‍ර- අමුද්‍රව්‍ය | | 4,821.00 | 7,291.00 |
| | යන්ත්‍රසූත්‍ර | | 4,44,745.00 | 5,19,745.00 |
| | ඩීසල් - කර්මාන්ත ශාලාව | | 1,11,434.48 | 1,11,434.48 |
| | - විදුලි ජනකය | | 39,107.00 | 34,941.00 |
| | ලිපිද්‍රව්‍ය තොගය | | 2,61,091.95 | 1,03,032.20 |
| | පාරිභෝගික ද්‍රව්‍ය තොගය | | 2,47,041.00 | 42,665.00 |
| | | | **12,74,712.95** | **11,81,080.20** |
| 13 | **අත්තිකාරම්** | | | |
| | උත්සව | | 67,050.35 | 52,800.35 |
| | ගමන් වියදම් | | 37,979.40 | 28,199.40 |
| | අතුරු අත්තිකාරම් | | 1,99,039.72 | 1,09,915.15 |
| | අතුරු අත්තිකාරම්-ප්‍රධාන කාර්යාලය | | 17,106.60 | 17,106.60 |
| | | | **3,21,176.07** | **2,08,021.50** |
| 14 | **වෙනත් ජංගම වත්කම්** | | | |
| | සේවාවන් | | 675.00 | 675.00 |
| | නිවාස කුලී තැන්පතු | | 9,50,000.00 | |
| | සිදු කෙරෙමින් පවතින වැඩ | | 4,95,697.27 | |
| | | | **14,46,372.27** | **675.00** |
| 15 | **සමකොටස්** | | | |
| | ආරම්භක ප්‍රාග්ධනය | | 6,99,07,594.42 | 6,99,07,594.42 |
| | රජයේ ප්‍රදාන | | 83,68,214.00 | 83,68,214.00 |
| | විදේශ ණය | | 7,27,50,229.02 | 7,27,50,229.02 |
| | පොදු අරමුදල - ප්‍රාග්ධන | | 11,46,90,471.79 | 10,59,10,250.00 |
| | වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය | | 3,47,02,988.00 | |
| | සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | | (8,92,11,227.47) | (8,12,38,009.36) |
| | | | **21,12,08,269.76** | **17,56,98,278.08** |
| 16 | **පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කිරීම** | | | |
| | පාරිතෝෂික අරමුදල | | 3,39,45,662.45 | 2,81,98,189.00 |
| | | | **3,39,45,662.45** | **2,81,98,189.00** |
| | **ජංගම බැරකම්** | | | |
| 17 | **ගෙවිය යුතු දේ** | | | |
| | අත්තිකාරම් | **17.1** | 17,79,328.14 | 13,45,752.48 |
| | උපචිත වියදම් | **17.2** | 5,05,91,650.37 | 48,14,931.77 |
| | තැන්පතු | **17.3** | 4,13,070.00 | 5,56,070.00 |
| | රඳවා ගැනීම් | **17.4** | 8,11,009.28 | 13,21,763.94 |
| | ණයහිමි පාලන ගිණුම | **17.5** | 1,13,46,409.04 | 89,62,284.04 |
| | පෙර ලැබීම් | **17.6** | 3,86,625.63 | 3,86,625.63 |
| | | | **6,53,28,092.46** | **1,73,87,427.86** |

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| **17.1** | අත්තිකාරම් - අවිනිශ්චිත ගිණුම - පොදු | 2,01,090.56 | 2,01,090.56 |
| | - EPF | 11,11,274.20 | 9,86,556.50 |
| | - ETF | 1,51,537.39 | 1,34,530.43 |
| | - මුද්දර ගාස්තු | 9,550.00 | - |
| | - Payee/WHT | 2,96,466.81 | 20,065.81 |
| | විශේෂ වැටුප් අත්තිකාරම් | 9,409.18 | 3,509.18 |
| | | **17,79,328.14** | **13,45,752.48** |
| **17.2** | **උපචිත වියදම්** | | |
| | පොලිය සඳහා උපචිත බදු | 95,166.41 | 1,26,826.67 |
| | උපචිත වියදම් - පොදු | 59,24,468.17 | 46,87,975.10 |
| | ණයහිමියන්-ප්‍රධාන කාර්යාලය | 130.00 | 130.00 |
| | - වප් මඟුල් උත්සවය සඳහා ගෙවිය යුතු | 22,78,360.00 | |
| | - NSF ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 1,75,000.00 | |
| | - කාබනික ක්‍රමවේදය සඳහා ගෙවිය යුතු | 54,07,920.00 | |
| | - සැපයුම් සහ වටිනාකම් දාම සඳහා ගෙවිය යුතු | 1,50,370.00 | |
| | - අඹ ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 1,62,67,643.28 | |
| | - පේර ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 71,72,371.71 | |
| | - ගස්ලබු ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 40,27,194.90 | |
| | - කෙසෙල් ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 35,44,880.70 | |
| | - අමු මිරිස් ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 52,785.00 | |
| | - ආහාරයට ගන්නා තෙල් ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 3,35,908.65 | |
| | - බැර ලෝහ ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු | 18,43,645.70 | |
| | - ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු | 33,15,805.85 | |
| | | **5,05,91,650.37** | **48,14,931.77** |
| **17.3** | **තැන්පතු** | | |
| | ටෙන්ඩර් - පර්යේෂණ සහ සංවර්ධන | 4,13,070.00 | 5,56,070.00 |
| | | **4,13,070.00** | **5,56,070.00** |
| **17.4** | **රඳවාගැනීම්** | | |
| | කොන්ත්‍රාත් වැඩ | 2,47,831.15 | 1,86,826.96 |
| | නොගෙවූ වැටුප් | 2,68,724.39 | 2,68,724.39 |
| | නොගෙවූ වැටුප් - ප්‍රධාන කාර්යාලය | 200.00 | 200.00 |
| | අවලංගු කළ චෙක්පත් | 1,54,981.74 | 7,26,740.59 |
| | ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය 2 - මාතලේ | 1,39,272.00 | 1,39,272.00 |
| | | **8,11,009.28** | **13,21,763.94** |
| **17.5** | **ණයගැති පාලන ගිණුම** | | |
| | වෙනත් ණයගැතියන් - විවිධ නිෂ්පාදන | 3,29,295.00 | 3,75,545.00 |
| **17.5.1** | ප්ලාස්ටික් කූඩ අරමුදල | 6,40,900.00 | 26,87,630.00 |
| | තැම්බීමේ භාජන අරමුදල | 43,18,284.04 | 42,35,109.04 |
| | පැරණි වාහන විකිණීම | 60,57,930.00 | 16,64,000.00 |
| | | **1,13,46,409.04** | **89,62,284.04** |
| **17.5.1** | **ප්ලාස්ටික් කූඩ අරමුදල** | | |
| | 2017.01.01 දිනට ශේෂය | 26,87,630.00 | 1,03,53,965.95 |
| | අමාත්‍යාංශයට ගෙවන ලද | 20,58,530.00 | 92,51,445.95 |
| | | 6,29,100.00 | 11,02,520.00 |
| | ප්ලාස්ටික් කූඩ විකුණුම් | 11,800.00 | 15,85,110.00 |
| | | **6,40,900.00** | **26,87,630.00** |
| **17.6** | **අත්තිකාරම් ලැබීම්** | | |
| | අත්තිකාම් ලැබීම් - දැයට කිරුළ | 2,85,486.80 | 2,85,486.80 |
| | අත්තිකාම් ලැබීම් - NSF | 1,01,138.83 | 1,01,138.83 |
| | | **3,86,625.63** | **3,86,625.63** |

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| 18 | මහා භාණ්ඩාගාරයෙන් ලැබූ අරමුදල් - පුනරාවර්තන | **9,50,83,608.41** | **9,47,50,000.00** |

පොරොන්දු වූ පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් මුදා හරින ලද නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අදාළ අග්‍රිම ලබා නොදෙන ලදී.

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| 19 | වෙනත් නියෝජිතායතන වලින් ලැබූ අරමුදල් | | |
| | - SAARC | - | 12,38,309.79 |
| | - NSF | 6,39,477.23 | 7,88,605.01 |
| | - PPR | - | 25,000.00 |
| | - මහවැලි ව්‍යාපෘතිය | - | 10,09,600.00 |
| | - TOT | 9,47,481.00 | 51,37,621.78 |
| | - අඹ ව්‍යාපෘතිය | 1,40,08,503.28 | 86,63,004.26 |
| | - කාබනික ක්‍රමවේදය | - | 44,35,193.20 |
| | - ප්‍රදර්ශන - BMICH | 2,73,313.42 | 97,061.50 |
| | - ප්‍රදර්ශන - අම්පාර | - | 1,94,951.29 |
| | - ගොවි සතිය - දඹුල්ල | - | 19,07,500.00 |
| | - සැපයුම් දාමය | 6,76,832.00 | |
| | - කෙසෙල් ව්‍යාපෘතිය | 25,14,191.75 | |
| | - ගස්ලබු ව්‍යාපෘතිය | 36,48,754.95 | |
| | - පේර ව්‍යාපෘතිය | 46,22,924.71 | |
| | - අමු මිරිස් | 4,84,181.95 | |
| | - ආහාරයට ගන්නා තෙල් | 5,45,729.51 | |
| | - වප් මඟුල් උත්සවය | 22,78,360.00 | |
| | | **3,06,39,749.80** | **2,34,96,846.83** |

| | | 2017 (රු.) |
|---|---|---|
| 20 | ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | |
| | ගොඩනැගිලි | 28,93,918.88 |
| | පිරියත සහ යන්ත්‍රසූත්‍ර | 4,36,017.96 |
| | කාර්යාල උපකරණ | 3,08,574.35 |
| | පරීක්ෂණාගාර සහ පර්යේෂණ උපකරණ | 80,09,214.76 |
| | වෙනත් උපකරණ | 16,47,416.75 |
| | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 6,80,271.25 |
| | විදුලි සහ වෙනත් සවිකිරීම් | 51,603.70 |
| | පරිගණක සහ උපාංග | 11,18,240.00 |
| | දූරකථන සහ සවිකිරීම් | 13,303.05 |
| | පුස්තකාල පොත් | 40,944.10 |
| | වාහන | 25,56,000.00 |
| | | **1,77,55,504.80** |

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| 21 | **ආයතනය විසින් උත්පාදනය කළ ආදායම්** | | |
| | යන්ත්‍රෝපකරණ විකිණීම | (50,886.50) | 4,49,735.00 |
| | නේවාසිකාගාර ආදායම - නවාතැන් | 28,72,795.00 | 22,54,309.46 |
| | නේවාසිකාගාර ආදායම - ආහාරපාන | 3,21,214.75 | |
| | පුහුණු වැඩසටහන් | 7,01,920.11 | 6,53,468.82 |
| | උපදේශන ගාස්තු | 2,14,425.60 | 1,99,339.00 |
| | යන්ත්‍රසූත්‍ර සහතිකපත්‍ර පුහුණු පාඨමාලාව | 1,05,594.00 | - |
| | සහල් අයිස්ක්‍රීම් විකිණීම | - | 6,968.00 |
| | සම්මන්ත්‍රණ ශාලා ගාස්තු | 15,65,850.00 | 11,70,870.00 |
| | ප්‍රකාශන විකිණීම | 16,400.00 | 31,795.00 |
| | ගොවිපොළ විකිණීම් | 3,600.00 | 4,800.00 |
| | නියැදි පරීක්ෂණ ගාස්තු | 3,66,700.00 | 11,480.00 |
| | ස්ටිකර් ආදායම | 2,82,740.00 | |
| | පරීක්ෂණාගාර සේවා ආදායම | 33,93,879.19 | |
| | | **97,94,232.15** | **47,82,765.28** |
| 22 | **වෙනත් ආදායම්** | | |
| | පොලී ආදායම් | 33,56,255.21 | 28,62,095.29 |
| | නිවාස කුලී | 3,94,750.00 | 3,86,750.00 |
| | පොදු ආදායම | 6,22,318.76 | 5,37,163.15 |
| | වැටුප් රහිත | 3,451.80 | 19,555.83 |
| | අතුරුඑල විකිණීම | 34,398.00 | 6,420.00 |
| | දඩ මුදල් | - | 980.00 |
| | | **44,11,173.77** | **38,12,964.27** |
| 21.1 | **යන්ත්‍රසූත්‍ර නිෂ්පාදන අළෙවිය ලාභ අලාභ ගිණුම** | | |
| | යන්ත්‍රසූත්‍ර විකුණුම් - සහල් තැම්බීමේ භාජන | - | |
| | යන්ත්‍රසූත්‍ර විකිණීම - සහල් පෙති යන්ත්‍ර | 2,75,000.00 | 2,75,000.00 |
| | 2017.01.01 දිනට අමුද්‍රව්‍ය ශේෂය | 7,291.00 | |
| | එකතු කළා: අමුද්‍රව්‍ය මිලදී ගැනීම | 2,48,416.50 | |
| | | 2,55,707.50 | |
| | 2017.12.31 දිනට අමුද්‍රව්‍ය ශේෂය | 4,821.00 | |
| | **යන්ත්‍ර නිෂ්පාදන පිරිවැය ඉ/ගෙන ආ** | **2,50,886.50** | |
| | 2017.01.01 දිනට යන්ත්‍ර ශේෂය | 5,19,745.00 | |
| | **යන්ත්‍ර නිෂ්පාදන පිරිවැය ඉ/ගෙන ආ** | 2,50,886.50 | |
| | | **7,70,631.50** | |
| | එකතු කළා: යන්ත්‍ර මිලදී ගැනීම් | - | |
| | | **7,70,631.50** | |
| | 2017.12.31 දිනට යන්ත්‍ර ශේෂය | 4,44,745.00 | |
| | **නිෂ්පාදන පිරිවැය - යන්ත්‍ර විකුණුම්** | **3,25,886.50** | **3,25,886.50** |
| | **ලාභය** | | **(50,886.50)** |

| | | 2017 (රු.) | |
|---|---|---|---|
| **21.2** | නේවාසිකාගාර ආදායම් - නවාතැන් | | |
| | ආදායම් | 28,72,795.00 | |
| | වියදම් | - | |
| | | | **28,72,795.00** |
| **21.3** | නේවාසිකාගාර ආදායම් - ආහාර පාන | | |
| | ආදායම් | 22,78,339.75 | |
| | වියදම් | 19,57,125.00 | |
| | | | **3,21,214.75** |
| **21.4** | පුහුණු වැඩසටහන් | | |
| | ආදායම් | 10,40,858.25 | |
| | වියදම් | 3,38,938.14 | |
| | | | **7,01,920.11** |
| **21.5** | උපදේශන සේවා ගාස්තු | | |
| | ආදායම් | 4,21,926.00 | |
| | වියදම් | 2,07,500.40 | |
| | | | **2,14,425.60** |
| **21.6** | යන්ත්‍රසූත්‍ර සහතිකපත්‍ර පුහුණු පාඨමාලා ආදායම | | |
| | යන්ත්‍රසූත්‍ර සහතිකපත්‍ර පුහුණු පාඨමාලා ආදායම | 1,71,300.00 | |
| | යන්ත්‍රසූත්‍ර සහතිකපත්‍ර පුහුණු පාඨමාලා වියදම | 65,706.00 | |
| | | | **1,05,594.00** |
| **21.7** | පරීක්ෂණාගාර සේවා ආදායම | 53,50,000.00 | |
| | වියදම | 19,56,120.81 | |
| | | | **33,93,879.19** |
| **21.8** | පොළී ආදායම් | | |
| | NSB 1-0005-04-9129-2 අ/පුර | 32,026.84 | |
| | NSB 1-0001-07-3208-7 කො/පිටිය | 2,76,354.24 | |
| | NSB 2-0001-21-28187 කො/පිටිය | 9,68,082.20 | |
| | NSB 2-0001-21-28195 කො/පිටිය | 9,68,082.20 | |
| | NSB 2-0001-21-28179 කො/පිටිය | 9,68,082.20 | **32,12,627.68** |
| | රඳවා ගැනීමේ බදු | | |
| | NSB 1-0005-04-9129-2 A/pura | - | |
| | NSB 1-0001-07-3208-7 කො/පිටිය | 22,108.33 | |
| | NSB 2-0001-21-28187 කො/පිටිය | 77,446.58 | |
| | NSB 2-0001-21-28195 කො/පිටිය | 77,446.58 | |
| | NSB 2-0001-21-28179 කො/පිටිය | 77,446.58 | 2,54,448.07 |
| | ශුද්ධ බැංකු පොලී අදායම | | **29,58,179.61** |
| | වෙනත් පොලී ආදායම් | | |
| | විශේෂ අත්තිකාරම් පොලී | 8,044.64 | |
| | ආපදා ණය පොලී | 3,65,470.41 | |
| | විශේෂ ණය පොලී | 24,560.55 | **3,98,075.60** |
| | | | **33,56,255.21** |

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| | **වියදම්** | | |
| **23** | **වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ** | | |
| | වැටුප් සහ වේතන - ස්ථිර කාර්ය මණ්ඩලය | 5,10,11,942.84 | 4,55,36,057.66 |
| | අනියම් කාර්ය මණ්ඩලය | 23,73,201.93 | 17,73,394.11 |
| | සේ.අ.අ. | 75,66,985.92 | 66,92,816.26 |
| | සේ.භා.අ. | 18,50,184.04 | 16,73,205.17 |
| | ජීවන වියදම් දීමනාව | 1,17,19,110.00 | 1,07,74,496.51 |
| | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 22,39,985.03 | 19,50,364.71 |
| | වෙනත් දීමනා | 2,96,000.00 | 2,80,252.00 |
| | පර්යේෂණ දීමනා | 19,07,874.68 | 12,19,645.37 |
| | දිරිදීමනා | 5,25,545.66 | 2,20,893.98 |
| | පාරිතෝෂික | 85,38,818.05 | 41,82,511.22 |
| | | **8,80,29,648.15** | **7,43,03,636.99** |
| **24** | **සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික ද්‍රව්‍ය** | | |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 12,45,989.50 | 10,19,126.97 |
| | කාර්යාල අවශ්‍යතා, විවිධ වියදම් | 19,06,826.55 | 10,89,656.68 |
| | පර්යේෂණ ව්‍යාපෘති පාරිභෝගික ද්‍රව්‍ය | 8,35,707.49 | 9,08,417.52 |
| | නේවාසිකාගාර සහ මුළුතැන්ගෙයි වියදම් | 2,90,184.00 | 8,13,696.00 |
| | පර්යේෂණ ව්‍යාපෘති | 11,04,491.41 | 8,59,958.06 |
| | වාහන ධාවන වියදම් | 35,82,411.13 | 22,93,875.94 |
| | වාහන නඩත්තු | 34,41,558.10 | 28,80,608.54 |
| | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 28,88,032.91 | 23,69,949.62 |
| | යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 3,38,237.42 | 7,56,793.14 |
| | | **1,56,33,438.51** | **1,29,92,082.47** |
| **25** | **ක්ෂයවීම්** | | |
| | ගොඩනැගිලි | 28,93,918.88 | 29,09,335.81 |
| | පිරියත සහ යන්ත්‍රසූත්‍ර | 4,36,017.96 | 4,56,164.06 |
| | කාර්යාල උපකරණ | 3,08,574.35 | 3,16,434.17 |
| | පරීක්ෂණාගාර සහ පර්යේෂණ උපකරණ | 80,09,214.76 | 77,94,561.89 |
| | වෙනත් උපකරණ | 16,47,416.75 | 4,48,250.25 |
| | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 6,80,271.25 | 6,80,683.49 |
| | විදුලි සහ වෙනත් සවිකිරීම් | 51,603.70 | 40,248.70 |
| | පරිගණක සහ උපාංග | 11,18,240.00 | 11,62,539.96 |
| | දූරකථන සහ සවිකිරීම් | 13,303.05 | 27,484.67 |
| | පුස්තකාල පොත් | 40,944.10 | 36,052.10 |
| | වාහන | 25,56,000.00 | 25,56,000.00 |
| | | **1,77,55,504.80** | **1,64,27,755.10** |

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| 26 | වෙනත් වියදම් | | |
| | ගමන් වියදම් - දේශීය | 8,50,944.25 | 8,06,249.17 |
| | ගමන් වියදම් - විදේශීය | 13,99,555.32 | 10,98,749.95 |
| | කාර්ය මණ්ඩල තේ | 7,61,153.50 | 4,51,006.29 |
| | වාරික, ජර්නල සහ පුවත්පත් | 73,240.00 | 4,03,684.50 |
| | සම්මන්ත්‍රණ | 80,000.00 | 1,05,357.50 |
| | පුහුණු වැඩසටහන් | - | 8,05,182.65 |
| | සංග්‍රහ | 6,87,597.11 | 3,68,378.98 |
| | කොන්ත්‍රාත් ශ්‍රමය | 2,08,500.00 | 81,600.00 |
| | සුභසාධන | - | 4,000.00 |
| | රක්ෂණ සහ බලපත්‍ර | 5,63,403.65 | 4,42,223.96 |
| | විදුලි සන්දේශ | 25,92,792.70 | 14,38,057.61 |
| | තැපැල් ගාස්තු | 1,11,811.00 | 1,01,216.00 |
| | විදුලිය | 18,36,336.26 | 15,02,466.77 |
| | ජලය | 13,70,884.12 | 5,57,184.76 |
| | නිවාස කුලී | 12,24,956.00 | 3,01,748.00 |
| | වාහන සඳහා කල්බදු වාරික | 12,09,800.00 | |
| | වරිපනම් සහ බදු | - | 2,88,960.36 |
| | ප්‍රදර්ශන | 19,969.40 | 12,445.00 |
| | ප්‍රකාශන | 1,89,750.00 | 7,000.00 |
| | මානව සම්පත් සංවර්ධනය | 3,75,598.65 | 4,15,022.98 |
| | විගණන ගාස්තු | 2,50,000.00 | 2,50,000.00 |
| | නීති ගාස්තු | - | - |
| | නිල ඇඳුම් දීමනා | 72,003.00 | 2,24,000.00 |
| | | **1,38,78,294.96** | **96,64,534.48** |
| 27 | ව්‍යාපෘති වියදම් | | |
| | SAARC සඳහා වියදම් | - | 12,38,309.79 |
| | NSF ව්‍යාපෘතිය සඳහා වියදම් | 5,46,093.12 | 7,88,605.01 |
| | මහවැලි ව්‍යාපෘතිය සඳහා වියදම් | - | 4,65,392.73 |
| | සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වියදම් - TOT | 9,47,481.00 | 51,31,321.78 |
| | සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වියදම් - අඹ | 1,40,08,503.28 | 86,63,004.26 |
| | සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වියදම් - කාබනික | 4,980.00 | 44,35,193.20 |
| | සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වියදම් - සැපයුම් දාම | 6,76,832.00 | |
| | කෙසෙල් ව්‍යාපෘතිය සඳහා වියදම් | 25,14,191.75 | |
| | ගස්ලබු ව්‍යාපෘතිය සඳහා වියදම් | 36,48,754.95 | |
| | පේර ව්‍යාපෘතිය සඳහා වියදම් | 46,22,924.76 | |
| | අමු මිරිස් ව්‍යාපෘතිය සඳහා වියදම් | 4,84,181.95 | |
| | ආහාරයට ගන්නා තෙල් ව්‍යාපෘතිය සඳහා වියදම් | 5,45,729.51 | |
| | ප්‍රදර්ශන - BMICH | 2,73,313.42 | 99,123.80 |
| | ප්‍රදර්ශන - අම්පාර | | 1,94,951.29 |
| | ප්‍රදර්ශන ගොවිසතිය - දඹුල්ල | | 19,07,500.00 |
| | වප් මඟුල් උත්සවයේ වියදම් | 22,78,360.00 | |
| | | **3,05,51,345.74** | **2,29,23,401.86** |
| 28 | මූල්‍ය පිරිවැය | 29,109.37 | 37,611.64 |
| | | **29,109.37** | **37,611.64** |

| | | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|---|
| 29 | සමුච්චිත අතිරික්තය ගැළපීමෙන් මුදල් ප්‍රවාහයට බලපෑම | | | | |
| | සමුච්චිත අතිරික්තයට බැර කළ වටිනාකම | | | 6,54,005.00 | |
| | සමුච්චිත අතිරික්තයට හර කළ වටිනාකම | | | (4,34,150.51) | |
| | | | | 2,19,854.49 | |
| | මුදල් ප්‍රවාහයට බලපෑමක් ඇති නොකළ වටිනාක | | 48,920.00 | | |
| | | | (4,892.00) | 44,028.00 | |
| | මුදල් ප්‍රවාහ වැඩි වීම | | | 1,75,826.49 | |
| 30 | ගෙවිය යුතු දේ | | | | |
| | අත්තිකාරම් | 17.1 | | 17,79,328.14 | 13,45,752.48 |
| | උපචිත වියදම් | 17.2 | | 5,05,91,650.37 | 48,14,931.77 |
| | තැන්පතු | 17.3 | | 4,13,070.00 | 5,56,070.00 |
| | රඳවා ගැනීම් | 17.4 | | 8,11,009.28 | 13,21,763.94 |
| | ණයහිමි පාලන ගිණුම | 17.5 | | 1,13,46,409.04 | 89,62,284.04 |
| | පෙර ලැබීම් | 17.6 | | 3,86,625.63 | 3,86,625.63 |
| | | | | **6,53,28,092.46** | **1,73,87,427.86** |
| | **2017.01.01 දිනට ශේෂය** | | | 1,73,87,427.86 | 2,43,04,636.98 |
| | **අඩුකළා :2017.12.31 දිනට ශේෂය** | | | 6,53,28,092.46 | 1,73,87,427.86 |
| | **බැරකම් වැඩිකිරීම/අඩුකිරීම** | | | **4,79,40,664.60** | **(69,17,209.12** |
| 31 | **වෙනත් ජංගම නොවන බැරකම්** | | | | |
| | **පාරිතෝෂික අරමුදල සඳහා වෙන්කිරීම්** | | | | |
| | **2017.01.01 දිනට ශේෂය** | 16 | | 2,81,98,189.00 | 2,76,06,601.15 |
| | **අඩුකළා :2017.12.31 දිනට ශේෂය** | | | 3,39,45,662.45 | 2,81,98,189.00 |
| | **බැරකම් වැඩිවීම/(අඩුවීම)** | | | **57,47,473.45** | **5,91,587.85** |
| 32 | **ජංගම වත්කම්** | | | | |
| | තොග | 12 | | 12,74,712.95 | 11,81,080.20 |
| | අත්තිකාරම් | 13 | | 3,21,176.07 | 2,08,021.50 |
| | තැන්පතු | 14 | | 14,46,372.27 | 675.00 |
| | ණයගැති පාලන ගිණුම | 11.1 | | 4,91,927.39 | 4,91,927.39 |
| | උපචිත ආදායම් | 11.2 | | 4,84,29,997.89 | 21,20,432.87 |
| | | | | **5,19,64,186.57** | **40,02,136.96** |
| | **2017.01.01 දිනට ශේෂය** | | | 40,02,136.96 | 33,13,845.25 |
| | **අඩුකළා :2017.12.31 දිනට ශේෂය** | | | 5,19,64,186.57 | 40,02,136.96 |
| | **ජංගම වත්කම් වැඩිවීම/අඩුවීම** | | | **4,79,62,049.6** | **6,88,291.71** |
| 33 | **දේපල, පිරියත සහ උපකරණ** | | | | |
| | වර්ෂය තුළ එකතු කිරීම් | | | 4,13,81,739.50 | 1,86,29,436.14 |
| | වත්කම් ප්‍රත්‍යාගණනය කළ වටිනාකම | | | (3,98,15,000.00) | (1,15,93,784.71) |
| | වර්ෂය තුළදී මුදල් ප්‍රවාහය හරහා වත්කම් වැඩි වීම | | | **15,66,739.50** | **70,35,651.43** |

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| 34 | ආයෝජන - තැන්පතු | | |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28195 -කොල්ලුපිටිය | 1,00,00,000.00 | 1,00,00,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001- 21-28187 -කොල්ලුපිටිය | 1,00,00,000.00 | 1,00,00,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2- 0001-21-28179 -කොල්ලුපිටිය | 1,00,00,000.00 | 1,00,00,000.00 |
| | | **3,00,00,000.0** | **3,00,00,000.0** |
| | ආපදා ණය | 89,20,746.12 | 96,40,525.33 |
| | විශේෂ ණය | 6,95,061.55 | 5,42,460.96 |
| | | **96,15,807.6** | **1,01,82,986.2** |
| | **මුළු ජංගම නොවන වත්කම්** | **3,96,15,807.6** | **4,01,82,986.2** |
| | **2017.01.01 දිනට ශේෂය** | 4,01,82,986.29 | 6,01,77,402.96 |
| | **අඩුකළා :2017.12.31 දිනට ශේෂය** | 3,96,15,807.67 | 4,01,82,986.29 |
| | **ජංගම නොවන වත්කම් වැඩිවීම/අඩුවීම** | **(5,67,178.62** | **(1,99,94,416.67** |
| 35 | **කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන ද<br>බැංකුවේ ඇති මුදල්** | | |
| | ලංකා බැංකුව -ටොරින්ටන් ශාඛාව | 57,95,171.51 | 42,71,183.18 |
| | මහජන බැංකුව - අනුරාධපුරය | 1,74,59,429.11 | 34,42,336.91 |
| | අත් මුදල් | 5,000.00 | 5,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | 7,66,106.46 | 7,00,085.52 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 57,78,243.83 | 35,19,184.10 |
| | **2017.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන ද** | **2,98,03,950.9** | **1,19,37,789.7** |
| 36 | **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන ද<br>බැංකුවේ ඇති මුදල්** | | |
| | ලංකා බැංකුව -ටොරින්ටන් ශාඛාව | 47,80,171.51 | 57,95,171.51 |
| | මහජන බැංකුව - අනුරාධපුරය | 1,32,15,927.11 | 1,74,59,429.11 |
| | අත් මුදල් | 5,000.00 | 5,000.00 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0005- 04-9129-2-අනුරාධපුර | 7,98,133.30 | 7,66,106.46 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1- 0001- 07-32087-කොල්ලුපිටිය | 90,62,621.68 | 57,78,243.83 |
| | **2016.12.31 දිනට මුදල් සහ මුදල් හා සමාන ද** | **2,78,61,853.6** | **2,98,03,950.9** |

37 පලතුරු සහ එළවලු ප්‍රවාහනයේදී සිදු වන පසු අස්වනු හානිය අවම කර ගැනීම සඳහා ඇසුරුම් ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම පිණිස 50% ක සහන මිලකට ගොවීන්, වෙළෙන්දන් සහ එක්රැස් කරන්නන්ට ලබාදුන් ප්ලාස්ටික් කූඩ. එම තොග මේ වන තෙක් ඔවුන්ට ලබා දී නොමැත. 2017.12.31 දිනට ප්ලාස්ටික් කූඩ තොගයෙහි පිරිවැය **1,77,463.1**

38 2006.10.25 දින වී අලෙවි මණ්ඩලයෙහි වත්කම් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයට මාරු කර ඇත. කෙසේවෙතත්, ගිණුම් මඟින් පෙන්වා ඇත්තේ වී අලෙවි මණ්ඩලයෙන් මාරු කරන ලද වත්කම් වල පොත් අගයන් වේ. වී අලෙවි මණ්ඩලයෙන් ලද වත්කම් ප්‍රත්‍යාගණනය කෙරෙමින් පවතී.

39 අපගේ එක් ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෙකු වන කේ.ඩී.ඊබට් සහ පුත්‍රයෝ හෝල්ඩිං පෞද්ගලික සමාගම අනුරාධපුර කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගිවිසුම් දෙකකට එළඹ ඇත. ඔවුන් ගිවිසුමට පටහැනිව අමතර වැඩකොටස් කිපයක් සිදු කර ඇත. ගිවිසුමට පටහැනි අමතර වැඩ කොටස් සඳහා ගෙවීම් නතර කිරීමෙන් අනතුරුව, ඔවුන් විසින් 2006.11.28 දින රු. 30,806,979.10 ක් ගෙවන ලෙස ඉල්ලා එන්තරවාසි දෙකක් එවා ඇත. අතිරේක වැඩ සඳහා ගෙවීම් වෙනුවෙන් රු. 5,329,344.62 ක් හා රු. 5,477,634.48 ක් වශයෙනි. තවද මුළු ගෙවීම රු. 10,806,979.10ක් හා ඔවුන්ගේ අලාභය රු. 20,000,000.00 වන සේ මුළු මුදල වන රු. 30,806,979.10 ක් දින 14 ක් ඇතුළත ගෙවන ලෙස ඉල්ලීම් කර ඇති අතර එසේ නොවුනහොත් ඒ සම්බන්ධව කටයුතු කරන බවත් දන්වා ඇත. නමුත් ආයතනය ඉල්ලීම සම්බන්ධව ප්‍රතිචාරයක් දක්වා නොමැති අතර ඔවුන් විසින් එන්තරවාසියට අනුව ආයතනයට එරෙහිව නඩු පවරා නොමැත.

40 පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ අනුදත් ප්‍රාග්ධනය රු. 500,000,000.00 කි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්සීපී/ඒපී/ඊ/අයිපීඑච්ටී/ 01/2017/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 04 දින

සභාපති,

පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

**පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :- 01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය

02. ලේකම්, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. එන්සිපී/ඒපී/ඊ/අයිපීඑච්ටී/01/2017/14

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018නොවැම්බර්04දින

සභාපති,

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ඔක්තෝබර් 16 දින නිකුත් කර ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 oag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

---------------------------------------------

(i) ප්‍රමිතයේ 25 ඡේදය (ආ) පරිදි සමාලෝචිත වර්ෂයේ වාහන විකිණීමෙන් ලද රු.6,057,930ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ii) ප්‍රවර්ථන වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාළ මුදල් ප්‍රවාහය රු.26,753,844ක් ලෙස දක්වා තිබුණද ඒ තුළ මුදලින් ගෙවීම් නොකරන ලද රු.9,803,454 ක් ඇතුළත් වී තිබුණි

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

ප්‍රමිතයේ 65 වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.63,410,396 ක් වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

NAOSL



(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

-----------------------------------------------

ප්‍රමිතයේ 15 වන ඡේදය ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට තොග ගිණුම්ගත කළ යුතු වුවත් ආයතනය සතු වසර 03කට වඩා පැරණි උපලබ්ධි වටිනාකමක් නොමැති හා ආයතනය තුළ භෞතිකව නොපවතින තොග ශේෂ 03ක් රු.64,973 ක් වූ අගයකට ඉතිරි තොග යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අයත් එහෙත් දෙසැම්බර් 31 දින වන විටද ගෙවීම් කර නොතිබුණු වාහන 2 ක අලුත්වැඩියා වියදම් රු.259,000ක්වූ බිල්පත් වටිනාකම උපචිත වියදම් ලෙස නොදැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ගෙවියයුතු වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් 03කට අදාලව පොලී ආදායම රු.364,095ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ජංගම ගිණුමකට සෘජුව ලැබී තිබුණු රු.686,153ක් හඳුනාගෙන නිවැරදි ලෙජර් ගිණුම්වලට ගලපා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී සේවකයෙකුගේ රු.67,030ක් වූ දළ වැටුප රු.670,030ක් ලෙස සලකා ගණනය කිරීම හේතුවෙන් රු.6,331,500ක් වැඩියෙන් පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රසායන ද්‍රව්‍ය තොග අයිතම 119 ක වටිනාකම තොග යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ශේෂ ලෙස වර්ෂ 5 කටත් පෙර සිට පැවත එන එකතු වටිනාකම රු.572,222ක්වූ ගිණුම් ශේෂ හතරක් අයකර ගැනීමට ප්‍රවර්ථන වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එකතුව එකතු වටිනාකම් රු.321,174ක් වූ වර්ෂ 2කට වඩා පැරණි අත්තිකාරම් ගිණුම් ශේෂ 4ක් අයකර ගැනීමට ප්‍රවර්ථන වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2004 වර්ෂය සිට නොගෙවූ වැටුප් ලෙස දක්වා තිබූ රු.268,724ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවීමකින් තොරව ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සංවර්ධන ව්‍යාපෘති යටතේ සහන පදනම මත ප්‍රතිලාභීන් වෙත ලබාදුන් වී තම්බන ඇලුමිනියම් උපකරණ අලෙවියෙන් එක්රැස් වූ රු.4,318,284ක් වටිනා ප්‍රතිලාභී දායක මුදල් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ගෙවීමෙන් තොරව 2009 වර්ෂයේ සිට බැරකමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්වා තිබෙන නමුත්, එය නිරවුල් කිරීමට 2018 අගෝස්තු 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් අනුව උපචිත වියදම් රු.6,458,146 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වියදම රු.5,924,468 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.533,678 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 570 සහ 571 | 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අයත් රු.134,500ක් වටිනා ටෙන්ඩර් ඇප තැම්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | එකතුව රු.1,002,498 ක් වටිනා තොග වර්ග 6 ක් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| ආ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 ඡේදය | 2016 හා 2017 වර්ෂවල අබලන් වූ වාහන විකිණීමෙන් ලද රු.6,057,930ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |

## 2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරින් 10 දෙනෙකු විසින් ලබාගෙන තිබූ රු.217,000ක අත්තිකාරම් මුදලින් රු.107,828ක් විධිමත් අනුමැතියක් රහිතව නවාතැන් බිල්පත් පියවීම සඳහා වැය කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම වියදම පියවීමට කටයුතු නොකර නොපියවූ අත්තිකාරම් යටතේ දක්වා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,193,072ක ඌනතාවයක් ඇතිවී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,506,446ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,313,374ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ස්වයං උත්පාදන ආදායම් රු.5,011,467 කින් වැඩිවීම ඉහත ඌනතාවය අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක දායකයේ වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ දායකය පිළිවෙලින් රු.97,592,080 ක් හා රු.81,224,945 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) 2015 වර්ෂයේ ආරම්භ කර තිබුණු " Estimation of heave metal contamination in Some Popular vegetables grown in different districts of Sri Lanka යන පර්යේෂණය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද 2018 අගෝස්තු 30 දින වන විටත් එම අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

ආ) 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු " Studies of wine production from locally available groups" යන පර්යේෂණය 2018 මාර්තු අවසන් කිරීමට සැලැසුම් කර තිබුණ ද 2018 ජූනි 30 දින වන විටත් පර්යේෂණයේ අවසන් වාර්තාව සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් පසුගිය වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කර තිබූ විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති 05 ක් විධිමත් ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකිරීම හා විනිවිදභාවයෙන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම හේතුවෙන් විවිධ බාහිර ආයතනවල විමර්ශනයන්ට භාජනය වී තිබුණු අතර එම විමර්ෂණ වල නිර්දේශ හා ඊට වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් 2018 ජූනි 30 දක්වා ආයතනය හෝ කෘෂිකර්ම අමාත්‍යාංශය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබුණු මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.16,076,078 ක් වටිනා උපකරණ 50 % ක ප්‍රජාදායකත්වයක් සහිතව ප්‍රතිලාභීන් වෙත ලබාදීම වෙනුවට අයෙතනයට අයිතිය හෝ භාරකාරත්වය තබා ගනිමින් ගිවිසුම්ගතව ප්රතිලාභීන් වෙත නොමිලේ ලබා දී තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) ආයතනයේ ගිණුම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණ පරිගණක මෘදුකාංගය මිලදී ගෙන මාස 05ක පමණ කාලයක් තුළ එම මෘදුකාංගය පිරික්සුම් පිටපතක් (trial version) ලෙස භාවිතා කරමින් පැවතුණු අතර එය බලපත්‍ර ලත් නීත්‍යානුකුල මෘදුකාංගයක් බවට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආහාර වර්ග 07ක බැර ලෝහ වර්ග 04ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබුණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,956,120ක වියදමක් දරා නියැදි 500 ක් පරීක්ෂා කර එයින් හඳුනාගත් ප්‍රතිඵල කෘෂිකර්ම අමාත්‍යාංශයට හා අදාළ අනෙකුත් ආයතනයන්ට ඉදිරිපත් නොකර එම වාර්තා රඳවාගෙන තිබුණු නමුත්, එම ව්‍යාපෘතියේ වියදම් වෙනුවෙන් රු.5,350,000 ක් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

ඇ) ආයතනයේ වාහන අවශ්‍යතා වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ආයතනය වෙත ලබා දෙන ලද කැබ් රථ 06ක් සහ ජීප් රථ 01 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන පටිපාටියට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද රහිතව, අලුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට යොමුකර තිබූ අතර 2018 මැයි 30 දක්වා එම වාහන අලුත්වැඩියා කර ආයතනයේ අවශ්‍යතා සඳහා යොදාගෙන නොතිබුණි.

ඈ) ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ අවසන් වීමෙන් පසු එම පර්යේෂණ සමාලෝචනය කිරීම සඳහා සහ තාක්ෂණය සමාජගත කිරීමට අවශ්‍යය නිර්දේශ ලබා දීමට කටයුතු කරන පර්යේෂණ සමාජගත කිරීමේ කමිටුව සමාලෝචිත වර්ෂය තුළ රැස් වී නොතිබුණි.

### 4.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

රුපියල් මිලියන 15.2 ක් වටිනා Gas Chromatography Mass Spectrometry System (GCMS) උපකරණය 2014 වර්ෂයේ දෙසැම්බර් ස්ථාපිත කිරීමෙන් පසුව 2017 දෙසැම්බර් මස 31 දින දක්වා වසර 03ක කාලයක් පර්යේෂණ කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවති අතර මෙම කාලය තුළ මෙම උපකරණ සේවා කිරීම සඳහා ආයතනය විසින් රු.536,255 ක වියදමක් දරා තිබුණි.

### 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

නියමිත දින වලදී බිල්පත් නොගෙවීම හේතුවෙන් ජලය හා විදුලි බිල්පත් පියවීමේදී රු.45,532 ක ප්‍රමාද ගාස්තු ආයතන අරමුදලින් ගෙවා තිබුණි.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයෙහි 15.1(II) ඡේදය හා ආයතනයේ බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව නිලධාරියෙකුගේ වැටුප් පරිමාණය නියම කිරීමේදී එහි 4 වැනි වැටුප් පියවරට එලඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු බව දක්වා තිබුණද, ආයතනය තුළ ආරම්භයේ සිට වර්තමානය දක්වා කිසිදු සේවා කාණ්ඩයක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි. කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපවත්වා පරිවාස කාලයේ සිටින නිලධාරීන් වසර 03 ඉක්ම වූ පසු ස්ථිර කිරීම, උසස් කිරීම,වැටුප් වර්ධක ලබා දීමද අඛණ්ඩව සිදුකර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණ ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් සහල් සැකසුම්කරුවන්, ගොවි සංවිධාන හා රාජ්‍ය නොවන ආයතන ලෙස පොදුවේ ප්‍රතිලාභීන් ලෙස හඳුනාගෙන තිබූ නමුත්, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක දක්වමින් නිශ්චිත ආයතන හඳුනාගෙන තිබූ බවට හා එම ආයතන සමඟ සහභාගිත්ව ප්‍රවේශයක් නිරූපණය වන බවට නිරීක්ෂණය නොවිය.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඹ සැපයුම් අගයදාම කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට ඇසුරුම් පෙට්ටි නිර්මාණය කර සැපයීම සඳහා ලංසු ඇගයීමේදී ප්‍රවාහන වියදම් පිළිබඳ නොසලකා ඒකක මිල පමණක් සලකා අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ බැවින් ගිවිසුම්ගත මුදල ඉක්මවා රු.63,673ක් ගෙවීම් කර තිබුණි.

(ආ) පැපොල් සැපයුම් අගයදාම කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇසුරුම් පෙට්ටි නිර්මානය කර සැපයීම සඳහා ලංසු කැඳවීමේදී සතියක් තුළ ඇසුරුම් පෙට්ටි 4,000ක් නිර්මාණය කොට සැපයීම අවශ්‍ය බවට කොන්දේසියක් ඇතුළත් කර තිබූ අතර සති 4ක් ඇතුළත සැපයුම සිදුකල හැකි බව දක්වා තිබූ අවම ලංසුව

ප්‍රතික්ෂේප කර ඊළඟ අවම ලංසුකරුට ඇණවුම ලබා දී තිබූ නමුත් සැපයුම සිදු කිරීමට මාස 2ක කාලයක් ගත වී තිබුණු හෙයින් පළමු අවම මිල ගණන් සුදුසුකම් ලත් ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ආයතනයට රු.801,760ක අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය ප්‍රකාරව කුලී පදනමට හෝ බදු පදනමට ගොඩනැගිලි ලබා ගැනීමේදී සම්පූර්ණ බදු කාල සීමාවට අදාල බදු වටිනාකම ප්‍රසම්පාදන සීමාව තීරණය කිරීම සඳහා සලකා බැලිය යුතු වුවත්, කොළඹ කාර්යාලය සඳහා කුලී පදනමට ගොඩනැගිල්ලක් ලබාගැනීමට සිදුකළ ප්‍රසම්පාදනයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව වර්ෂ 5ක් සඳහා බදු වටිනාකම රු.මිලියන 28.5 ක් වූ අතර ඒ අනුව ප්‍රසම්පාදන සීමාව ගණනය කිරීමේදී අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවකට යොමුකල යුතු වුවද ඊට පටහැනිව වසර 1 යි මාස 6 ක් සඳහා බදු වටිනාකම වූ රු.මිලියන 8.5 මත සුළු දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය විසින් ගොඩනැල්ල කුලියට ගැනීමට තීරණය කර තිබුණි.

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

ආයතනය විසින් සිදුකරන පර්යේෂණ කටයුතු ගුණාත්මක සහ වෘත්තීය මට්ටමින් සිදු කෙරෙන බවට තහවුරු කර ගැනීම සඳහා ආයතනයේ පිහිටුවා ඇති පර්යේෂණ උපදේශක මණ්ඩලය වසරකට අවම වශයෙන් 4 වරක් වත් රැස්වී පර්යේෂණ යෝජනා හා පර්යේෂණවල ප්‍රගතිය ඇගයීමට ලක්කල යුතු බවට 2010 අගෝස්තු 19 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේදී නියෝගකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයට අදාළ පර්යේෂණ 15ක් පිළිබඳ ඇගයීම් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ උපදේශක සභාව රැස් වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| අ) පර්යේෂණ පාලනය | (i) ආයතනය විසින් සිදුකරනු ලබන පර්යේෂණ සඳහා පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |

(ii) පර්යේෂණ උපදේශක මණ්ඩලයේ උපදෙස් ලබාගෙන නොතිබීම.

| | |
|---|---|
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) ආයතනයේ කාර්ය මණ්ඩලය විධිමත් පුහුණු වැඩසටහන්වලට යොමුකර නොතිබීම |
| | (ii) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණද පවත්වා නොතිබීම |
| (ඇ) රසායනාගාර පාලනය | (i) ආයතනය සතු රසායනාගාරය ප්‍රමිතිකරණයට භාජනය කර නොතිබීම |
| | (ii) රසායනාගාර උපකරණවලින් ඵලදායීව ප්‍රයෝජනය ගෙන නොතිබීම. |
| | (iii)රසායනාගාර තොග පිළිබඳ භෞතික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබීම. |
| (ඈ) නේවාසිකාගාර පාලනය | විධිමත් පාලන ක්‍රමයක් යොදා ගනිමින් නේවාසිකාගාර ආදායම් අයකර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති